

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

2022

කාර්යසාධන වාර්තාව

811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

පටුන

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම 1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 2
1.3 ප්‍රධාන කාර්යයන් 3
1.4 සංවිධාන සටහන 7
1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ හා වනජීවී සංරක්ෂණ ප්‍රාදේශීය කාර්යාල 7
1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 8
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 8

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය 9
2.1.1 ඒකාබද්ධ අරමුදල - මූල්‍ය ප්‍රගති සාරාංශය 9
2.1.2 වනසත්ව සංරක්ෂණ අරමුදල - මූල්‍ය ප්‍රගති සාරාංශය 10
2.1.3 පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ (ESCAM) ව්‍යාපෘතියේ ප්‍රගතිය 11
2.1.4 වෙනත් අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 12
2.1.5 ඒකාබද්ධ අරමුදල හා වනසත්ව සංරක්ෂණ අරමුදල යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය 13
2.2 2022 වසරේ දී දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද සුවිශේෂී සේවාවන් 16
2.3 දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් හා පවතින අභියෝග 23

පරිච්ඡේදය 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 28
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 28
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 29
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 30
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 31
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 31
3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය 31
3.7 මු.රෙ.208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 32
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 32
3.9 විගණකාධිපතිගේ වාර්තාව 33

පරිච්ඡේදය 04

කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 42

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 43

5.2 තිරසර සංවර්ධන අභිමතාර්ථ 14,15 සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 43

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 46

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය 46

6.3 මානව සම්පත් සංවර්ධනය 46

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව 49

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය ශාක හා සත්ත්ව ප්‍රජාවන් සංරක්ෂණය කිරීම ජාතික වශයෙන් ප්‍රමුඛ අවශ්‍යතාවයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමුද්‍ර තීරය ඇතුළු දේශසීමාව තුළ වනජීවී සම්පත් දිගු කාලීනව ආරක්ෂා කිරීමේ හා සංරක්ෂණය කිරීමේ ප්‍රමුඛ කාර්යභාරය පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටය. ඒ සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලයක් ස්ථාපිත කර කළමනාකරණය කිරීමේ නීතිමය වගකීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර එසේ ස්ථාපිත කරන ලද රක්ෂිත භූමි ප්‍රමාණයේ මුළු එකතුව වර්ග කි.මී 12000 ක් ඉක්මවයි. එය ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 18% ක් පමණ වේ. මේ දක්වා ශ්‍රී ලංකාව තුළ ජාතික රක්ෂිත 40 ක්ද අභයභූමි 68 ලෙස වනජීවී රක්ෂිත 108 ක් ප්‍රකාශයට පත්කර ඇත. මෙරට වනජීවී රක්ෂිත දිවයින තුළ ව්‍යාප්තව ඇති ආකාරය ඇමුණුම 1 හි දැක්වේ. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ වනජීවී රක්ෂිතවලින් බැහැර පෙදෙස් වල වනජීවී සම්පත් ආරක්ෂා කිරීම සඳහා අදාල නීතිමය ප්‍රතිපාදන පනවා ඇති අතර, ඒ සඳහා අවශ්‍ය නීතිමය බලයද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

විවිධත්වයෙන් පොහොසත් මෙරට ජෛව සම්පත් ඒවායේ ස්වභාවික වාසස්ථාන සමඟ සංරක්ෂණය කිරීමට අමතර වශයෙන් වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය ශ්‍රී ලංකාව තුල පවත්නා කෘෂි කර්මාන්තයට සහ විදුලි බල නිෂ්පාදනයට වැදගත් වන විශාල ප්‍රමාණයේ ජලාශ සහ ඒවායේ පෝෂක ප්‍රදේශවල ද දිගු කාලීන ආරක්ෂාව තහවුරු කරයි. සේනානායක සමුද්‍රය ඇතුළු ගල්ඔය නිම්නයේ ජලාශ, බොහෝ මහවැලි ජලාශ, මධ්‍යම සහ උතුරු මැද පළාත්වල පිහිටි මහවැලි ගඟෙන් ජලය ලබා ගන්නා ජලාශ, උඩවලව, මව්ආර, ලුණුගම්වෙහෙර සහ වෙහෙරගල යනාදී මෙරට දකුණු ප්‍රදේශයේ පවත්නා ජලාශ, වනජීවී රක්ෂිත ප්‍රදේශ ජාලය තුළ පිහිටයි. තවද, පරාක්‍රම සමුද්‍රය, කවුඩුල්ල, මින්නේරිය, ගිරිතලේ, පදවිය, කලාවැව සහ යෝධ වැව වැනි ප්‍රධාන වැව් රාශියකද ජල පෝෂක ප්‍රදේශ වනජීවී රක්ෂිත ප්‍රදේශ ලෙස සංරක්ෂණයට ලක්කර ඇත. මෙසේ වනජීවී රක්ෂිත ප්‍රදේශ තුළ පිහිටන කෘෂි කර්මාන්තය සහ ජල විදුලිය නිෂ්පාදනය සඳහා වැදගත් වන ජලාශ සංඛ්‍යාව 40 ඉක්මවයි.

තවද මහවැලි, කැළණි, කළු සහ වලවේ යන ප්‍රධාන ගංගාවල්වල ඉහල ජල පෝෂක ප්‍රදේශද පිහිටා ඇත්තේ ශ්‍රී පාද අඩවිය ස්වභාව රක්ෂිතය, හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය වැනි වනජීවී රක්ෂිත තුලය. එමෙන්ම ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසර ආශ්‍රිතව සංචාරක කර්මාන්තයේ ප්‍රධාන විභවයක් වන්නේ ද වනජීවී රක්ෂිත තුල පවතින වනජීවී සම්පත් වන අතර වනජීවී රක්ෂිත ආශ්‍රිත සංචාරක කර්මාන්තය තුළින් 2022 වර්ෂය තුළ ලබා ඇති ආදායම රුපියල් මිලියන 1864 පමණවේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

- **වර්තමාන සහ අනාගත පරපුර උදෙසා වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම.**

මෙහෙවර

- **සහභාගිත්ව කළමනාකරණය මගින් වනජීවී උරුමයන් සංරක්ෂණය තහවුරු කිරීම.**

අරමුණු

- ජාතික හා අන්තර් ජාතික ප්‍රතිපත්තීන් හා ගැලපෙන අයුරින් වනජීවී සම්පත් සංරක්ෂණය සඳහා උපාය මාර්ගික ජාතික සැලසුම් සහ වැඩසටහන් සම්පාදනය කිරීම.

- සුවිශේෂී විද්‍යාත්මක වැදගත්කමක් සහිත ස්ථාන සහිතව රට තුල පවත්නා සියලුම ස්වභාවික පරිසර පද්ධතීන් නියෝජනය වන පරිදි රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම ඒවා කාලානුරූපව සහ වනජීවී විශේෂවල ධරණීය ගහන පවත්වාගෙන යාහැකි ආකාරයට සංඛ්‍යාත්මකව සහ ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම සහ ඒවා අතර සම්බන්ධතා ස්ථාපිත කිරීම.

- වඩාත් සුදුසු පර්යේෂණ දත්ත හා තොරතුරු මත පදනම්ව රක්ෂිත ප්‍රදේශ හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම හා කළමනාකරණය කිරීම සහ ඒවායේ තත්ත්වයන් යාවත්කාලීන සුපරීක්ෂාව.

- අන්තරායට ලක් වූ විශේෂ සඳහා සංරක්ෂණ සැලසුම් පිළියෙල කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

- අදාළ රක්ෂිත ප්‍රදේශ තුළ පරිසර පද්ධතීන් සංරක්ෂණය කරන අතරම පාරිසරික සංචාරක කටයුතු සඳහා ඇති අවස්ථාවන් භාවිතා කිරීමේ පහසුකම් සැපයීම.

- රට තුළ වනජීවී සම්පත් නීතිවිරෝධී ලෙස භාවිතයන් අවම කිරීම සඳහා වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සහ වෙනත් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් කළමනාකරණයට අදාළ වන විද්‍යාත්මක පර්යේෂණ දිරිගැන්වීම.

- පුහුණු කිරීම්, දිරිගැන්වීම සහ අභිප්‍රේරණය මගින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියාවන් වර්ධනය කිරීම.

- අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මහජනතාව තුළ සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහල නැංවීම.

- රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන් එකී රක්ෂිත ප්‍රදේශ මත යැපීම අඩුකිරීම සහ එම ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම මගින් සංරක්ෂණය සඳහා එකී ප්‍රජාවන්ගේ දායකත්වය ඉහල නැංවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර අනුව කටයුතු කිරීම සඳහා ප්‍රධාන කාර්යාල මට්ටමින් ප්‍රධාන තාක්ෂණික අංශ 08 ක් හා ප්‍රාදේශීය වනජීවී කලාප කාර්යාල 12 කි. මෙම අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන කාර්යයන් හා වගකීම් පිළිබඳ විස්තර පහත වේ.

1.3.1 සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.
- විශේෂ සංවර්ධන සහ සංරක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනා සැකසීම.
- දෙපාර්තමේන්තුවේ මාසික, ත්‍රෛයිමාසික හා වාර්ෂික වාර්තා, වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම.
- දෙපාර්තමේන්තුවේ www.dwc.gov.lk වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- දීපව්‍යාප්ත රේඩියෝ සන්නිවේදන පද්ධතිය හා අභ්‍යන්තර දුරකථන ජාල පද්ධතිය නඩත්තුව, කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්ත පරිගණක ජාලය කළමනාකරණය, නඩත්තුව හා වැඩිදියුණු කිරීම.
- ජාතික උද්‍යානවල ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම පරිගණකගත කිරීම හා GIS ඒකකය කළමනාකරණය.

1.3.2 ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය

- රක්ෂිත ප්‍රදේශ සඳහා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම සහ සංශෝධනය.
- සම්පත් වට්ටෝරු පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම.
- රක්ෂිත ප්‍රදේශ ජාලය විමර්ශනය කිරීම, ප්‍රකාශයට පත් කිරීම, මායිම් මිනුම් කිරීම සහ සලකුණු කිරීම.
- වනජීවී වාසස්ථාන කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය සහ පසුවිපරම් කිරීම.
- ආක්‍රමණශීලී ශාක සඳහා විශේෂ පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- ගිනිපටි සහ වනජීවී වාසස්ථාන වල සංඝටක කළමනාකරණය.
- පරිසර දූෂණය පාලනය සහ වනජීවී විශේෂ ආරක්ෂා කිරීමේ සැලසුම් සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය.
- රක්ෂිත ප්‍රදේශ තුළ යෝජිත සංවර්ධන කටයුතු සඳහා හා රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා පරිසර ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම.

1.3.3 නීති ක්‍රියාත්මක කිරීම් අංශය

- වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කිරීම හා අදාල රාජකාරී සඳහා දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට අවශ්‍ය සහාය ලබාදීම හා පනත යටතේ සිදු කළ යුතු ලියාපදිංචි කිරීම් හා බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදු කිරීම.
- වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ අවශ්‍ය සංශෝධන සිදුකිරීම සහ ඒ යටතේ පනවනු ලබන රෙගුලාසි පිළියෙල කිරීම.
- නීතිපති දෙපාර්තමේන්තුව හා නීතීය ක්‍රියාත්මක කිරීමට ආදාල අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු.
- CITES සම්මුතිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම.

1.3.4 අලි සංරක්ෂණ අංශය

- ජාතික අලි සංරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, වනඅලි සම්බන්ධ දත්ත හා තොරතුරු එකතුව කළමනාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- වනඅලි පිවිසුම් ප්‍රදේශ හා පිවිසුම් ආරක්ෂාවන පරිදි වනඅලි සංරක්ෂණ ප්‍රදේශ ස්ථාපිත කිරීම.
- වනඅලි හානි සඳහා වන්දි ගෙවීම.
- ජනාවාස තුළට වනඅලින්ගේ පිවිසීම බාධක වන පරිදි විදුලි වැට, ජීවවැට සහ වෙනත් නවීන ක්‍රමවේද මගින් භෞතික බාධක ස්ථාපිත කිරීම.
- වනඅලි කළමනාකරණය හා ඒ සඳහා අවශ්‍ය වන භාණ්ඩ මිලදී ගැනීම.

1.3.5 පර්යේෂණ හා පුහුණු අංශය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම හා විවිධ බාහිර පාර්ශවයන් සිදුකරන පර්යේෂණවලට අදාළ උපදෙස් සහ අනුමැතිය ලබාදීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ වැඩසටහන් සඳහා නිලධාරීන් යොමුකිරීමට කටයුතු කිරීම.
- පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් සහ ග්‍රාමීය ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රදර්ශන වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම.
- ජාතික වනජීවී පුහුණු කේන්ද්‍රයේ කටයුතු අධීක්ෂණය කර එම කටයුතු පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තු ප්‍රචාරක සහ මාධ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම.

1.3.6 සංචාරක සේවා කළමනාකරණ පාරිසරික සංචාරක හා ජනවිනිදුම්කරණ අංශය

- සංචාරක සේවා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, නව සංචාරක පැකේජ හදුන්වාදීම හා සංචාරක කටයුතු විවිධාංගීකරණය.
- සංචාරක සේවා සහ පාරිසරික සංචාරක කටයුතු අලෙවිකරණය සහ ප්‍රවර්ධනය.
- රක්ෂිත ප්‍රදේශ තුළ සහ ඒ ආශ්‍රිතව සංචාරක සේවා තොරතුරු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- රක්ෂිත ප්‍රදේශ මත අවට ප්‍රජාවගේ යැපීම අඩු කිරීම සඳහා එම ප්‍රජාවන් රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සඳහා දායක කර ගැනීම.
- අධ්‍යාපනික සහ ව්‍යාප්ති වැඩසටහන් මගින් මහජනතාව සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම.

1.3.7 වනජීවී සෞඛ්‍ය කළමනාකරණ අංශය

- වනසතුන්ගේ සෞඛ්‍ය තත්වයන් සහ රෝග තත්වයන් සම්බන්ධව සුපරීක්ෂණය සහ ක්‍රියාකාරී වීම.
- වනසතුන්ගේ පශු වෛද්‍ය ආරක්ෂණය සම්බන්ධව ඵලදායී සහ වේගවත් ප්‍රතිචාර දැක්වීම.
- වනසතුන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම.
- සුභසාධනය පිළිබඳ සුපරීක්ෂාකාරී වීම සහ ගුණාත්මක බව වර්ධනය කිරීම හා වනසත්ව මිනිස් ගැටුම් කළමනාකාරීත්වයට දායකවීම.
- වනසත්ව පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ඇත්අතුරු සෙවන කළමනාකරණය කිරීම.
- වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන වලට අනුකූලව අවශ්‍ය සහතික නිකුත් කිරීම, අවශ්‍ය අවස්ථාවලදී අධිකරණ ක්‍රියාවලියට සහාය වීම.

1.3.8 ඉංජිනේරු අංශය

- රක්ෂිත ප්‍රදේශ තුල භෞතික පහසුකම් වැඩිදියුණු කිරීමේ සහ ඉදිකිරීම් සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- රක්ෂිත ප්‍රදේශ තුල සහ අවට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තුව හා මාර්ග පද්ධතිය නඩත්තුව සහ ඉදිකිරීම.

1.3.9 මානව සම්පත් සංවර්ධන අංශය

- මානව සම්පත් සහ සාමාන්‍ය පරිපාලන සැලසුම් පිළියෙල කිරීම.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම, උසස් කිරීම, පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.
- කාර්ය මණ්ඩලයට අදාල ස්ථානමාරු , විනය කටයුතු ,සේවා දීර්ඝ, විශ්‍රාම ගැන්වීම, විශ්‍රාම වැටුප් සහ වැන්දඹු සහ අනත්දරු අරමුදල් පිළිබඳ කටයුතු සිදුකිරීම.
- නිලධාරීන්ගේ කාර්ය සාධන කටයුතු , වැටුප් වර්ධක ගෙවීම, හදිසි අනතුරු වන්දි ගෙවීම.
- ප්‍රවාහන කටයුතු අධීක්ෂණය හා ක්ෂේත්‍ර ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාව.

1.3.10 මුදල් අංශය

- දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් ශීර්ෂවල හා වනසත්ව සංරක්ෂණ අරමුදලේ ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලබාගැනීම, කලාප කාර්යාලවලට ඒවා ලබාදීම, ප්‍රාදේශීය කාර්යාලවල අග්‍රිම ප්‍රතිපූර්ණය, සියළුම ලැබීම් ගෙවීම් ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට මාසිකව වාර්තා කිරීම හා මාසික ගිණුම් වාර්තා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීම.
- වාර්ෂිකව ආදායම්, වියදම්, වනසත්ව සංරක්ෂණ අරමුදල, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සහ පොදු තැන්පත් සඳහා ගිණුම් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ සියළු ප්‍රසම්පාදන කටයුතු හා ගබඩාවේ කටයුතු අධීක්ෂණය හා පාලනය.
- විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන සියළුම විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

1.4. සංවිධාන සටහන (ඇමණුම 06 යටතේ බලන්න.)

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ හා වනජීවී සංරක්ෂණ ප්‍රාදේශීය කාර්යාල

කාර්යය මණ්ඩලය

ක්ෂේත්‍රය
1694

1956

ප්‍රධාන කාර්යාලය
262

වනජීවී....



වනජීවී රක්ෂිත ප්‍රදේශ

රක්ෂිත ප්‍රදේශ වර්ගය		දැනට ප්‍රකාශයට පත්කර ඇති සංඛ්‍යාව
ජාතික රක්ෂිත	දැඩි ස්වභාව රක්ෂිත	03
	ජාතික උද්‍යාන	26
	ස්වභාව රක්ෂිත	**09**
	වන පිවිසුම්	01
	අලි කළමනාකරණ රක්ෂිත	**01**
එකතුව		40
අභයභූමි		68
මුළු එකතුව		**108**

ප්‍රධාන කාර්යාලය

- සැලසුම් හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය
- ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය
- නීති ක්‍රියාත්මක කිරීම් අංශය
- අලි සංරක්ෂණ අංශය
- පර්යේෂණ හා පුහුණු අංශය
- සංචාරක සේවා කළමනාකරණ පාරිසරික සංචාරක හා ජනවිඳුම්කරණ අංශය
- වනජීවී සෞඛ්‍ය කළමනාකරණ අංශය
- ඉංජිනේරු අංශය
- මානව සම්පත් සංවර්ධන අංශය
- මුදල් අංශය

ක්ෂේත්‍රය

- කලාප කාර්යාලය - 13
- කලාප පශු වෛද්‍ය ඒකක - 08
- පශු වෛද්‍ය රෝහල් - 01
- උඩවලව ඇත් අතුරු සෙවන
- උඩවලව අලි රැඳවුම් මධ්‍යස්ථානය
- වනඅලි පාලන ඒකක - 04
- ජාතික උද්‍යාන මූලස්ථාන - 17
- රන්දෙනිගල පුහුණු මධ්‍යස්ථානය
- වනජීවී අඩවි ආරක්ෂක කාර්යාලය -74
- වනජීවී බීට්ටු කාර්යාලය - 85

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

වනජීවී සංරක්ෂණ අරමුදල (ව.සං.අ.)

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ නීතිමය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකාව තුළ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය ලබාගැනීමේ අරමුණින් 1967 දී පිහිටුවන ලද මෙම අරමුදලේ අරමුණු පහත දැක්වේ.

1. වනසතුන්ගේ ආරක්ෂාව සහ සංරක්ෂණය සඳහා මහජනතාවගේ දායකත්වය සහ සහයෝගය වැඩි කර ගැනීම.
2. වනජීවී රක්ෂිත ප්‍රදේශ නඩත්තු කිරීම.
3. වනජීවී සංරක්ෂණ සඳහා දක්වනු ලබන දායකත්වය අගය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ නිලධාරීන්ට සහ මහජනතාවට ත්‍යාග මුදල් සහ වෙනත් ප්‍රසාද දීමනා ගෙවීම.
4. වනජීවී අපරාධවලට එරෙහිව තොරතුරු ලබාදෙන්නන් සඳහා ප්‍රසාද දීමනා ගෙවීම.

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ තෝරාගත් රක්ෂිත ප්‍රදේශවල ඇතුලත හා පිටත ගොඩබිම්, සමුද්‍රීය සහ තෙත්බිම් පරිසර පද්ධති කළමනාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමයි.

ව්‍යාපෘතියේ නම	පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)
දායක නියෝජිතායතනය	ලෝක බැංකුව
ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු.මි.	3,600 (ඇ.ඩො. මි.35)
ව්‍යාපෘති කාලසීමාව	2017 - 2023.05.31

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය 2022

2.1.1 ඒකාබද්ධ අරමුදල - මූල්‍ය ප්‍රගතිය සාරාංශය

වැය විෂය අංකය	වැඩසටහන	ප්‍රතිපාදන (රු. මි)	මූල්‍ය ප්‍රගතිය	
			(රු. මි)	%
	මූලධන වත්කම් වැඩි දියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම			
284-01-01-2001	ගොඩනැගිලි හා නිර්මිතයන් අළුත්වැඩියා කිරීම	6.30	6.05	96
284-01-01-2002	යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම	2.00	1.94	97
284-01-01-2003	වාහන අළුත්වැඩියාව	8.00	7.52	94
	මූලධන වත්කම් අත්පත් කරගැනීම	`		
284-01-01-2103	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	1.50	1.30	87
284-01-01-2105	රක්ෂිත ප්‍රදේශවල මායිම් සලකුණු කිරීම	5.50	4.57	83
284-01-01-2401	මානව සම්පත් සංවර්ධනය කිරීම	5.00	4.77	95
284-01-01-2506	රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය	2.00	1.87	93
284-01-01-08-2105	විදුලි වැටවල් ඉදි කිරීම	97.00	62.07	64
284-01-01-09-2506	රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරීම	78.70	47.82	61
284-01-01-10-2506	රක්ෂිත ප්‍රදේශවල මාර්ග ජාලය නඩත්තු කිරීම	19.00	8.52	45
284-01-01-15-2509	විල්පත්තු ජාතික උද්‍යානය අවට බලපෑම් කලාපය කළමනාකරණ ව්‍යාපෘතිය (GIZ)	2.00	1.58	79
	මුළු එකතුව	**227.00**	**148.00**	**65**

- **2022 විශේෂ අයවැය යෝජනා මූල්‍ය ප්‍රගතිය**

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන (රු.මී.)	මූල්‍ය ප්‍රගතිය	
			(රු.මී)	%
i	විදුලි වැට උපකරණ මිලදී ගැනීම	581.00	498.60	86
ii	දැනුවත් කිරීමේ වැඩ සටහන් සහ පුහුණු වැඩසටහන	5.00	2.71	54
	එකතුව	586.00	501.31	86

2.1.2 දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍ය ප්‍රගතිය සාරාංශය (වනසත්ව සංරක්ෂණ අරමුදල)

වැය විෂය අංකය	විස්තරය	ඇස්තමේන්තුව (රු.මි.)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
	පුනරාවර්තන වියදම්			
3000	ස්වේච්ඡා මාර්ගෝපදේෂක දීමනා	80.00	71.027	89
3002	ගමන් වියදම්	100.00	91.182	91
3003	ඉන්ධන	92.00	76.217	82
3005	ප්‍රසාද දීමනා (උසාවි දඩ මුදල් ලැබීම්)	19.00	18.804	99
3006	අලි පිළිස්සීම්	4.00	3.415	85
3007	මහජනයාට සතුන්ගෙන් වන හානි සඳහා වන වන්දි	200.00	195.798	97
3008	අලි වෙඩි මිළදී ගැනීම	250.00	217.128	87
3009	වනඅලි පළවාහැරීමේ වියදම්	5.00	5.000	100
3010	සතුන් සඳහා ආහාර	150.00	92.37	62
3011	සේවා ගාස්තු	51.50	49.701	97
3012	වාහන අලුත්වැඩියා	80.00	57.993	72
3013	විදුලිය සහ ජලය	17.00	14.428	85
3014	තුවක්කු බලපත්‍ර	0.50	0.353	71
3016	ගුවන්විදුලි පණිවුඩ	4.80	4.027	84
3017	බංගලා වල රෙදි පිරිසිදු කිරීමේ වියදම්	2.00	1.222	61
3018	නීතීඥ ගාස්තු	0.30	3.000	100
3019	විවිධ වියදම්	42.00	39.986	94
3021	වෛද්‍ය සැපයීම්	15.00	10.375	69
3022	ජාතික උද්‍යානවල කාර්යාලීය වියදම්	13.00	6.621	51
3023	නිලධාරීන්ගේ රෝහල් හා වෛද්‍ය ගාස්තු	2.00	-	0
3024	නිලධාරීන්ගේ ජීවිත හා ශාරීරික හානි සඳහා වන හානි වන්දි	2.00	0.475	24
3030	සංචාරක නිවාස හා උද්‍යාන පවත්වාගෙනයාම	30.00	24.573	82
3034	විදේශීය පුහුණු	30.00	3.29	11
3036	දිරි දීමනා	140.00	123.028	88
3037	සම්මුති සම්මන්ත්‍රණය	10.27	3.361	33
3045	නඩත්තු සේවක කුට් සඳහා අවශ්‍ය උපකරණ	0.09	0.077	86
3046	නඩත්තු සේවක ආහාර දීමනා	350.00	46.627	13
3048	නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ	7.50	3.567	48
3051	අධ්‍යාපන හා ව්‍යාපෘති කටයුතු	0.03	0.025	83
3055	දේශීය පුහුණු	10.00	9.754	98
3056	සිසු දරු රක්ෂණය	3.00	-	0
	එකතුව	**1710.99**	**1173.42**	**68.5**

වැය විෂය	විස්තරය	ඇස්තමේන්තුව (රු.මි.)	වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)
	මූලධන වියදම්			
3015	වඳවීමේ තර්ජනයට ලක්වී ඇති වනජීවීන් සංරක්ෂණයට අදාළ වියදම්	51.00	26.28	52
3020	යන්ත්‍ර උපකරණ, විදුලි උපකරණ , ගොඩනැගිලි යනාදිය නඩත්තුව	25.00	22.60	90
3028	උද්‍යානවල සංචාරකයින්ගේ හා සතුන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම	46.50	12.17	26
3029	වාහන/ යන්ත්‍රෝපකරණ/බෝට්ටු මිලදී ගැනීම	38.15	12.39	32
3039	ප්‍රධාන කාර්යාලයේ අංශවල පහසුකම් වැඩිදියුණු කිරීම	6.00	1.96	33
3040	ජනවිභිදුම්කරණය	2.03	1.84	91
3041	සමුද්‍රජීවී සංරක්ෂණය	0.57	0.27	48
3042	වාසස්ථාන සුපෝෂණ කටයුතු	58.00	28.66	49
3049	විදුලි වැට ඉදිකිරීම	161.60	32.26	20
3050	කාර්යාල උපකරණ	12.33	9.54	77
	එකතුව	**401.17**	**147.99**	**37**
	මුළු එකතුව	**2,112.16**	**1,323.85**	**63**

2.1.3 පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ (ESCAM)ව්‍යාපෘතියේ ප්‍රගතිය

කාර්යයන්	ප්‍රධාන කාර්ය දර්ශක	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය රු.මි.
සංරචක 2a – වනජීවී රක්ෂිත ප්‍රදේශ අවට ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම.	**උඩවලව ජාතික උද්‍යානයේ** හඳගිරිගොඩ ග්‍රාමයේ මීමැසි පාලන ව්‍යාපෘතිය පිළිබඳ පුහුණු වැඩසටහන්. බුලත් වගාව පිළිබඳ පුහුණු වැඩ සටහන්	02	1.10
	ගල්ඔය ජාතික උද්‍යානයේ රතුගල ආදිවාසී පවුල් 105 ක් සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	01	0.56
සංරචක 2b - අලි-මිනිස් යහපැවත්ම තුලින් වනඅලි හානි අවම කිරීම.	ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ මාර්ගය ඉදිකිරීම.	කි.මී.3.33	ගෙවීම් කටයුතු සිදු කරමින් පවතී.
	වනඅලින්ට GPS කරපටි පැළඳවීම	08	0.75
	ලුනුගම්වෙහෙර ජාතික උද්‍යානයේ අධියර I,II,III ,IV හි ජල මූලාශ්‍ර අලුත්වැඩියා කිරීම.	100 %	13.63
	ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ සපත්තු පාලම් ඉදිකිරීම(කි.මී.40 ක් අභ්‍යන්තර මාර්ග පද්ධතියට අදාලව).	48	31.57
සංරචක 3a-වනජීවී රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය සහ	අලුත්වැඩියා කරන ලද ජල ප්‍රභවයන්(13) හා වැව් සංඛ්‍යාව(03) (උඩවලව)	16	9.81
	යාල ජාතික උද්‍යානයේ අදියර1 හා 11 හි කාර්ය මණ්ඩලය හා සංචාරකයින් සඳහා ජලය සැපයීමේ	100%	72.51

කළමනාකරණය.	ව්‍යාපෘතිය යටතේ ජලනල එලීම(කි.මී.20) හා ජල ටැංකි සැපයීම.		
	වනජීවී රෝහල ඉදිකිරීම(අම්පාර)	80%	10.03
	වනජීවී රෝහල සඳහා විද්‍යාගාර උපකරණ හා ලී බඩු උපකරණ මිලදී ගැනීම.	75%	7.26
	යාල ජාතික උද්‍යානයේ වනජීවී ක්ෂේත්‍ර නිලධාරින්ගේ නිල නිවාස අළුත් වැඩියාව.	100%	21.98
සංරචක 3b - වනජීවී රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම.	යාල ජාතික උද්‍යානයේ පටනංගල සංචාරක විවේකාගාරය,වාහන නැවතුම් අංගනය,වැසිකිලි පහසුකම් හා භූමි අලංකරණය.	75%	16.77
සංරචක 3c - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතන ධාරිතාව සහ අයෝජන හැකියාව වර්ධනය කිරීම.	අම්පාර වනජීවී රෝහල සඳහා ලීබඩු උපකරණ මිලදී ගැනීම.	100%	1.36

2.1.4 වෙනත් අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

මොරගහකන්ද - කළු ගඟ ව්‍යාපෘතිය යටතේ සිදුකරන වනජීවී සංරක්ෂණ කටයුතු

කළු ගඟ හා යෝජිත මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව ප්‍රේරක කලාපයක් ප්‍රකාශයට පත්කිරීම හා එහි මිනිස් ක්‍රියාකාරකම් අවම කිරීම මෙහි අරමුණ වන අතර ඒ යටතේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි දැක්වේ.

- ඉහත ප්‍රදේශය ආශ්‍රිතව වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා බාධක පිහිටුවීම.
- වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා ව්‍යාපෘතියට යටත් වන ප්‍රදේශයේ වනජීවී වාසස්ථාන දියුණු කිරීම.
- ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිත වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

කාර්යයන්	ප්‍රධාන කාර්ය දර්ශක	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය රු.මී.
වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම	**වස්ගමුව/සෝමාවතිය ජාතික උද්‍යානය** නිල නිවාස හා වැසිකිලි පද්ධතිය අළුත්වැඩියාව	03	4.46
වනජීවී රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	**මින්නේරිය ජාතික උද්‍යානය** මාර්ග සංවර්ධනය	කි.මී.13	1.32
	විවරණ මධ්‍යස්ථානය අළුත්වැඩියාව	01	0.77
වනජීවී මිනිස් ගැටුම අවම කිරීම	**මධ්‍යම වනජීවී කලාපය** රංටැඹේ විදුලි වැට ඉදිකිරීම සඳහා විදුලි වැට කණු මිලදී ගැනීම	-	2.61

විල්පත්තු ජාතික උද්‍යානය හා ස්වාරක්ෂක කළමනාකරණ ව්‍යාපෘතිය (GIZ)

2017 වර්ෂයේදී ජර්මන් රජයේ ආධාර ඇතිව ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මගින් 2022 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

විල්පත්තු ජාතික උද්‍යානයේ කුඹුක්විල විවේකස්ථානය ඉදිකිරීම, කල්පිටිය මුහුදු ක්ෂීරපායින් පිළිබඳ දැනුවත් කිරීමේ විවරණ පුවරු ඉදිකිරීම, එළුවන්කුලම පිවිසුමට එල්ලෙන පාලම ඉදිකිරීම, 30 සැතපුම් කණුව අඩවි ආරක්ෂක කාර්යාලය ඉදිකිරීම, කලාඔය පොකුරු කඳවුරු බිම් 02 ක් ඉදිකිරීම, පහල හේන්තොට හා පරණ තොටුපල සංචාරක නිවාස විවෘත කිරීම, ලාහුගල පැඩල් බෝට්ටු සවාරි ආරම්භ කිරීම, ගල්ඔය ජාතික උද්‍යානයේ නව ස්වභාවික මංපෙතක් ආරම්භ කිරීම, හික්කඩුව ජාතික උද්‍යානයේ ප්‍රවේශපත්‍ර පද්ධතිය පරිගණකගත කිරීම.

2.1.5 ඒකාබද්ධ අරමුදල හා වනසත්ව සංරක්ෂණ අරමුදල යටතේ සිදුකරන ලද සංවර්ධන කාර්යයන්හි භෞතික ප්‍රගතිය

කාර්යයන්	ප්‍රධාන කාර්ය දර්ශක	ඒකකය	2022 නිමැවුම්		
			ඒ.අ.	2022 අයවැය යෝජනා	ව.සං.අ.
වනඅලි-මිනිස් ගැටුම අවම කිරීම	විදුලි වැට ඉදි කිරීම (ඇමුණුම 02-වගුව 2.7)	කි.මී.	163	-	-
	විදුලි වැට නඩත්තු කටයුතු සඳහා අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂක නිලධාරීන්	සංඛ්‍යාව	3314	-	-
	වනඅලි පලවාහැරීම සඳහා අනුයුක්ත කර ඇති සිවිල් ආරක්ෂක නිලධාරීන්	සංඛ්‍යාව	722	-	-
	විදුලි වැට උපකරණ මිලදී ගැනීම	%	100	86	-
	විදුලි වැට ආරක්ෂක කුටි ඉදි කිරීම	සංඛ්‍යාව	-	-	132
	නඩත්තු කරමින් පවතින විදුලි වැට දිග	කි.මී.	5018	-	-
	මිල දී ගන්නා ලද අලි වෙඩි ප්‍රමාණය	සංඛ්‍යාව	-	-	1,281,740
රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරීම	අළුත්වැඩියා කරන ලද ජල ප්‍රභවයන් (වැව් ප්‍රතිසංස්කරණය - අරන්ගමුව,දෙයියන්ගේ වැව,පනාගම්මන,පාළු ඉලන්දගහ වැව)	සංඛ්‍යාව	04	-	01
	ඉවත්කරනලද ආක්‍රමණශීලී ශාක බිම් ප්‍රමාණය	හෙක්ටාර්	30	-	30
	ඉවත්කරනලද යටිරෝපණ බිම් ප්‍රමාණය	හෙක්ටාර්	498	-	-
	මාර්ගය දෙපස යටිකැලය නඩත්තු කිරීම	කි.මී.	-	-	127.9
	තෘණභූමි කළමනාකරණය (කුමන,විල්පත්තුව)	හෙක්ටාර්	53.83	-	90
	වියළි කාලයේදී වනසතුන්ට ජලය සැපයීම (ඩෙල්ෆ් දූපත)	සංඛ්‍යාව	-	-	01
රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරීම	සියළුම ජාතික උද්‍යාන සඳහා මායිම් කණු මිලදී ගැනීම	සංඛ්‍යාව	1500	-	-
	ස්ථාපිත කරන ලද හා අළුත්වැඩියා කරන ලද දැන්වීම් පුවරු	සංඛ්‍යාව	147	-	06
	ජාතික උද්‍යාන මැණුම් කිරීම(යෝජිත කලාවැව ජා.උ. කිමී.72,සෝමාවතිය කි.මී.11.32)	කි.මී.	11.32	-	72
	අළුත්වැඩියා කරන ලද කාර්යාල හා පරිපාලන ගොඩනැගිලි.	සංඛ්‍යාව	03	-	-

ගොඩනැගිලි ඉදි කිරීම හා අළුත් වැඩියාව	අළුත්වැඩියා කරමින් පවතින පරිපාලන ගොඩනැගිලි	සංඛ්‍යාව	-	-	01
	අළුත්වැඩියා කරන ලද බීට්ටු කාර්යාල	සංඛ්‍යාව	-	-	01
	අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා	සංඛ්‍යාව	-	-	01
	අළුත්වැඩියා කරන ලද ස්වේච්ඡා මාර්ගෝපදේශ නිල නිවාස	සංඛ්‍යාව	-	-	07
	ස්ථාපිත කරන ලද විදුලි සැපයුම් පද්ධති	සංඛ්‍යාව	03	-	01
	ගිරිතලේ පශු වෛද්‍ය රෝහලේ වහලය අළුත්වැඩියාව	%	-	-	100
	රන්දෙනිගල පුහුනු මධ්‍යස්ථානයේ වහලය අළුත්වැඩියාව	%	-	-	100
මාර්ග ජාලය අළුත්වැඩියාව	අළුත්වැඩියා කරන ලද මාර්ගවල දුර (විල්පත්තු ජා.උ./වරාහේන පස්කෙම)	කි.මී.	27.1	-	40
	අළුත්වැඩියා කරන ලද සපත්තු පාලම්	සංඛ්‍යාව	06	-	05
	අළුතින් ඉදිකරන ලද සපත්තු පාලම්	සංඛ්‍යාව	06	-	-
පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම	අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා	සංඛ්‍යාව	-	-	01
	නල්ලතන්නිය ශ්‍රීපාද මාර්ගයේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුනු කිරීම	%	-	-	100
	වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කටයුතු මගින් ලද ආදායම (ඇමුණුම 03).	රු. මී.	1864	-	-
	ජාතික උද්‍යාන නැරඹීම සඳහා පැමිණි සංචාරකයින් (ඇමුණුම 03).	සංඛ්‍යාව	1,111,827	-	-
	ස්වේච්ඡා මාර්ගෝපදේශකයින්	සංඛ්‍යාව			264
රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	ශ්‍රී පාද අඩවියේ සනීපාරක්ෂක පහසුකම් ඉදි කිරීම	සංඛ්‍යාව	-	-	04
	සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කරන ලද කාර්යාල	සංඛ්‍යාව	01		01
	සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කරන ලද සංචාරක බංගලා. (තලවිල, පනික්කවිල, මානවිල,ලුනුවැව)	සංඛ්‍යාව	-	-	04
	ජල මූලාශ්‍ර ප්‍රතිසංස්කරණය හා නව ඉදි කිරීම (විල්පත්තුව,තඹබෝව,යාල මාදුරුඔය)	සංඛ්‍යාව	05	-	01
	ජල ටැංකි ඉදිකිරීම හා ජල සැපයුම් පහසුකම් ලබාදීම (දඹේතලාව,කැකිරාවල,රන්දෙනිගල)	සංඛ්‍යාව	02	-	01
	නල ළිං ඉදිකිරීම	සංඛ්‍යාව	04	-	02
	ජලපෙරණ ලබාදීම (බකමූණ ,කළුන්දැව බීට්ටු කාර්යාල)	සංඛ්‍යාව	02		
	වැඩි දියුණු කරන ලද විදුලි සැපයුම් පද්ධති. (කරුවලගස්වැව,ආනවිලුන්දාව,බූන්දල,යාල, කිණිහිරිය/මහකනදරාව)	සංඛ්‍යාව	04	-	01
සමුද්‍රජීවීන් සංරක්ෂණය	දොඩන්දුව කැස්බෑ සංරක්ණ මධ්‍යස්ථානයේ කන්ටේනර් පෙට්ටි අළුත් වැඩියාව	සංඛ්‍යාව	-	-	01
	සංචාරක කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් මුහුදු ඌරන් නිදර්ශක සැකසීම	සංඛ්‍යාව	-	-	03
වාහන අළුත්වැඩියාව	අළුත්වැඩියා කරන ලද වාහන	සංඛ්‍යාව	23	-	-
ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම හා අළුත්	පරිගණක හා ජායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියාව	සංඛ්‍යාව	09	-	-
	Apple Tab 01 හා Drone Camera 01 ඇතුලුව උපාංග.	සංඛ්‍යාව	-	-	01
	කුලී නිවාසවල පවතින කාර්යාල සඳහා මිලදී ගන්නා ලද ගිනිඅවි රඳවන සේප්පු.	සංඛ්‍යාව	-	-	10
	සිසිටිවී කැමරා මිලට ගැනීම.	සංඛ්‍යාව	-	-	04

වැඩියාව					
යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අළුත් වැඩියාව	වායු සමීකරණ සවි කිරීම හා අලුත් වැඩියාව	සංඛ්‍යාව	07	-	07
	යන්ත්‍රෝපකරණ අළුත් වැඩියාව	සංඛ්‍යාව	03	-	-
	දුරකථන පද්ධති ස්ථාපිත කිරීම හා වැඩිදියුණු කිරීම.	සංඛ්‍යාව	01		01
	විදුලිබල සැපයුම් පද්ධති ස්ථාපනය සඳහා උපකරණ මිලට ගැනීම (බූන්දල)	%	80	-	-
මානව සම්පත් සංවර්ධනය කිරීම	කෙටි කාලීන පුහුණු වැඩසටහන්	සංඛ්‍යාව	13	-	
	වනජීවී සංරක්ෂණය පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්	සංඛ්‍යාව	07	-	-
	පාරිසරික කටයුතු හා සංචාරක කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම	වැ. සංඛ්‍යාව	04	-	
	දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදුකරන ලද වනජීවී සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ	සංඛ්‍යාව	07	-	-
	පර්යේෂණ ප්‍රගතිය විමසීම හා දැනුවත් කිරීම් වලට අදාලව පවත්වන ලද පර්යේෂණ කමිටු රැස්වීම්	සංඛ්‍යාව	08	-	-
ජනවිභිදුම්කරන වැඩ සටහන්/ප්‍රචාරක වැඩ සටහන්	පාසැල් ළමුන් සඳහා පාසැල් බෑග් හා අනෙකුත් උපකරණ බෙදාදීම.	සංඛ්‍යාව	-	-	02
	ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම ව්‍යාපෘති හා ශ්‍රමදාන (බිම්මල් ව්‍යාපෘතිය, මීමැසි පාලන ව්‍යාපෘතිය, විසිතුරු පැල තවාන් ව්‍යාපෘතිය, අඩු ආදායම්ලාභීන් සඳහා පොල්පැල ලබාදීම)	සංඛ්‍යාව	-	-	11
	ලෝක තෙත්බිම් දින හා වනජීවී දින සැමරුම් වැඩසටහන්	සංඛ්‍යාව	02	-	-
	පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්	සංඛ්‍යාව	06	-	-
	වනඅලි මිනිස් ගැටුම අවම කිරීම පිළිබඳ ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන්	සංඛ්‍යාව	18	-	-
	විදුලි වැට නඩත්තු කටයුතු පිලිබඳ සිවිල් ආරක්ෂක නිලධාරීන් හා වනජීවී නිලධාරීන් දැනුවත් කිරීම	සංඛ්‍යාව	03	-	-
	අලි මිනිස් ගැටුම හා වනජීවී සංරක්ෂණය - මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩ සටහන්.	සංඛ්‍යාව	02	-	-
	වනජීවී සඟරාව මුද්‍රණය	සංඛ්‍යාව	1000	-	-
	රූපවාහිනී වාර්තා වැඩ සටහන (ආනවිලුන්දාව කඩොලාන ප්‍රතිෂ්ඨාපනය)	සංඛ්‍යාව	01	-	-
වනජීවී සංරක්ෂණය සඳහා නීතිය	වනජීවී අපරාධ වලට එරෙහිව ගන්නා ලද අධිකරණ ක්‍රියා මාර්ග	සංඛ්‍යාව	-	-	1021
	ස්ථාපිත කරන ලද ගිනිඅවි රඳවන	සංඛ්‍යාව	-	-	03
අනෙකුත් වනජීවී සංරක්ෂණ කටයුතු.	වනසතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා Portable DIGITAL – X –ray Machine මිලට ගැනීම.	සංඛ්‍යාව	-	-	01
	නිර්වින්දන තුවක්කු හා ඊට අදාල උපාංග	සංඛ්‍යාව	-	-	05
	අධිපීඩන සේදුම් යන්ත්‍ර	සංඛ්‍යාව	-	-	04
	Dan Inject නිර්වින්දන තුවක්කු අළුත් වැඩියාව	සංඛ්‍යාව	-	-	04
	ප්‍රතිකාර කරනලද අලින්	සංඛ්‍යාව			412
	ප්‍රතිකාර කරනලද අනෙකුත් සතුන් සංඛ්‍යාව	සංඛ්‍යාව			4757

2.2 2022 වසරේ දී දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද සුවිශේෂී සේවාවන්

- 2022 පෙබරවාරි මස 02 වන දිනට යෙදුන ලෝක තෙත්බිම් දිනය "තෙත් බිම් අගය කරමු, කළමනාකරණය කරමු, ප්‍රතිෂ්ඨාපනය කරමු, ආදරය කරමු"යන තේමාව යටතේ විල්පත්තුව ජාතික උද්‍යානයේදී පවත්වන ලදී.

- ලෝක වනජීවී දිනය 2022 මාර්තු 03 හෝර්ටන්තැන්න ජාතික උද්‍යානයේදී පවත්වන ලදී.



ලෝක වනජීවී දිනය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ESCAM ව්‍යාපෘතියේ මුහුණු පොත මගින් ප්‍රකාශයට පත්කල ආධුනික ජායරූප තරඟයේ ජයග්‍රාහකයින් හා පාසැල් සිසුන් සඳහා පවත්වනු ලැබූ වැඩ මුළුව

- වනජීවී ක්ෂේත්‍ර නිපුණතා වැඩිදියුණු කිරීමේ අරමුණින් 2022 ඔක්.30 දින සිට නොවැ.11 දින දක්වා එක්සත් ජනපද වනසංරක්ෂණ සේවා ආයතනයේ (United State Forest Service) අනුග්‍රහය ඇතිව පවත්වන ලද Sri Lanka ranger Teraining Pilot Programme සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් 15 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගි වන ලදී.

- 2022 වසරේ වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා පහත සඳහන් ලෙස අලි වෙඩි මිල දී ගෙන වනඅලි තර්ජන සහිත ප්‍රදේශවලට බෙදා හැර ඇත. කලාප වශයෙන් අලි වෙඩි බෙදාහැරීම පිළිබඳ විස්තර ඇමුණුම 02 හි 2.8 වගුවෙහි දැක්වේ.

අලිවෙඩි වර්ගය	ප්‍රමාණය	වියදම (රු.මි.)
ගිගුම්(ලොකු)	304,990	50.89
ගිගුම්(පොඩි)	585,000	81.44
සංඥා දහර	391,750	84.64
එකතුව	1,281,740	216.97

- වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් හා ගම්වාසින් එක්ව වනඅලි ගැටුම් බහුලව පවතින ග්‍රාම නිලධාරී මට්ටමින් දැනුවත් කිරීම, විදුලි වැට ඉදිකිරීම, ගම්මාන වල වනඅලි රැඳී සිටින ස්ථාන හඳුනාගෙන එම ස්ථාන එළිපෙහෙලි කිරීම හා අඳුරු ස්ථානවල බල්බ් සවිකිරීම වැනි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.



වනඅලි මිනිස් ගැටුම අවම කිරීම

අඳුරු ස්ථානවල බල්බ් සවිකිරීම.

විදුලි වැට ඉදි කිරීම,

ගම්මානවල වනඅලි රැඳී සිටින ස්ථාන හඳුනාගෙන එළි පෙහෙලි කිරීම,







- 2022 වර්ෂයේ අලි මිනිස් මරණවල වර්ගීකරණය, දේපල හානි හා ශාරීරික හානි සිදුවීම්වල ව්‍යාප්තිය, විදුලි වැට ඉදිකිරීම් පිළිබඳ තොරතුරු ඇමුණුම 02 මගින් දක්වා ඇත.

- දිවයින පුරා වනඅලි පහරදීම් හේතුවෙන් පීඩාවන්ට පත් වූ ජනතාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා වනඅලි හානි සඳහා වන්දි ගෙවීම සිදුකරන අතර 2022 වසරේ දෙසැම්බර් 31 වන විට ගෙවන ලද වන්දි ප්‍රමාණයන් පහත පරිදි වේ.

වන්දි වර්ගය	2022.12.31 දිනට වාර්තාවී ඇති සිදුවීම් සංඛ්‍යාව	2022.12.31 දිනට වන්දි ගෙවන ලද සිදුවීම් සංඛ්‍යාව*	2022.12.31 දිනට වාර්තාවී ඇති ගෙවීම්(රු.මි.)*
ජීවිත හානි	154	109	90.55
ශාරීරික හානි	179	179	9.49
දේපල හානි	2668	2668	88.16
එකතුව	**3001**	**2956**	**188.20**

(*ඉහත වන්දි මුදල් තුල 2022 වසරේ සිදුවූ හානිවලට අමතරව 2022 වසරට පෙර වසරවල සිදු වූ එහෙත් 2022 වසරේදී ඉදිරිපත් වූ ඉල්ලීම් සඳහා ගෙවිමිද අතුලත් වේ.)

- වනජීවී රක්ෂිත ජාලය තුල වන අපරාධ මැඩපැවත්වීම සඳහා වැටලීම් 1021 ක් සිදුකර වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ නීතිය ක්‍රියාත්මක කිරීම.



වනජීවී අපරාධ මැඩ පැවැත්වීම

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ ආරක්ෂිත ක්ෂීරපායී සතෙකු වන තිත්මුවකුගේ සමක් අත්අඩංගුවට ගැනීම.

- දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කරන ලද ශ්‍රී ලංකාවේ වනඇලින්ගේ DNA විශ්ලේෂණය පිළිබඳ දෙවැනි පර්යේෂණ පත්‍රිකාව අන්තර්ජාතික පිළිගැනීමකට ලක්ව ඇති පර්යේෂණ සඟරාවන් මගින් ප්‍රකාශයට පත්කිරීමට නියමිතය.
- කළු කොටියාගේ DNA විශ්ලේෂණය සාර්ථකව අවසන්කර ඇති අතර ඒ පිළිබඳව පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශයට පත්කිරීමට නියමිතය.
- දෙපාර්තමේන්තු නිලධාරිනියක විසින් ප්‍රථමවරට නකල්ස් රක්ෂිතයේ රඹුක්ඔළුව ප්‍රදේශයෙන් සොයාගත් "*Strobilanthes glandulata*" නමින් අළුත් ශාක විශේෂයක් ශාක ලෝකයට හඳුන්වාදෙන ලදී.

- Wildlanka අන්තර් ජාතික පර්යේෂණ සඟරාව 2022 වර්ෂයතුල පිටපත් 400 ක් මුද්‍රණය කිරීම.



***Wildlanka** අන්තර් ජාතික පර්යේෂණ සඟරාව*

2022 වර්ෂයේ දී ගුණාත්මකභාවයෙන් ඉහළ දෙස් විදෙස් පර්යේෂණ වාර්තා රාශියක් ඇතුලත්කර සඟරාව ප්‍රකාශයට පත්කර ඇත.

- වනසත්ව සංරක්ෂණ අරමුදලේ ප්‍රතිපාදන යටතේ ආනවිලුන්දාව අභය භූමියේ කඩොලාන ප්‍රතිෂ්ඨාපනය කිරීම.



කඩොලාන ප්‍රතිෂ්ඨාපනය

ආනවිලුන්දාව අභය භූමිය තුල හායනයවූ පරිසර පද්ධතිය යථාවත් කිරීම සඳහා කඩොලාන පැල 500 ක් රෝපණය කිරීම.

- වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුම, කාලීන සිදුවීම්, වාර්තාමය වැඩසටහන් පිළිබඳව විද්‍යානුකූලව කරුණු ලෝකයට ලබාදීම අරමුණු කර ගනිමින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් "Blue Green Media" නමින් YouTube වැනලයක් 2021 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙහි මුල්ම වැඩ සටහන 2021 ලෝක වනජීවී දිනය නිමිත්තකරගෙන පවත්වන්නට යෙදුනු විද්වත් සාකච්ජාවෙන් ආරම්භ කෙරුණු අතර මේවනවිට සාර්ථකව වැඩ සටහන් 13 ක් නිමා කිරීමට හැකිවිය. එම වැඩ සටහන් සඳහා ආරාධනා කරනු ලැබූ විද්වත් සම්පත් දායකයින්ගේ කැපවීම මෙම වැඩ සටහනේ සාර්ථකත්වය වඩාත් ඉහළ නැංවීමට පිටිවහලක් විය. මෙම වැඩසටහන හා සම්බන්ධවන වනජීවී ක්ෂේත්‍රය සම්බන්ධ කැමැත්තක් දක්වන පිරිස ඉහල යාමත් සමගම එම වැනලය තවත් වැනල 04 ක් සම්බන්ධ කිරීම මගින් පුළුල් විය.

✓ **නීල හරිත උරුමය (Blue Green Heritage)**

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතින් ආරක්ෂිත ශාක හා සතුන්ගේ හෙට දවස වෙනුවෙන් ආරක්ෂා කිරීම අරමුණු කරගනිමින් ඒවා පිළිබඳව කෙටි හැඳින්වීමක්, වාසස්ථාන, සංරක්ෂණ තත්ත්වය, නීතිමය තත්ත්වය, තර්ජන හා සංරක්ෂණය පිළිබඳව කෙටි වීඩියෝ පට නිෂ්පාදනය කරනු ලබයි. ඒ අතරින් 2022 වර්ෂය තුල නෙලු ශාක විශේෂය, බූ කටු හැන්ද,බිනර ශාකය(නිල් බිනර/සුදු බිනර/සිව් පෙති බිනර), කූඩලු ශාක විශේෂය, මහහැඩයා, මහ රත්මල් ආදී ශාක විශේෂ පිළබඳව කෙටි වීඩියෝ වැඩ සටහන් නිෂ්පාදනය කර ඇතුලත් කරන ලදී.



✓ **හරිත අරුත (Haritha Arutha)**

වනජීවී සංරක්ෂණය උදෙසා විවිධ පැතිකඩයන් ඔස්සේ කාලීන මාතෘකා අරමුණු කර ගනිමින් විද්වත් කථිකාවන් සංවිධානය කිරීමට සැලසුම්කර ඇති අතර 2022 වර්ෂය තුල වැඩ සටහන් 03 ක් සිදුකරන ලදී.

1. Archaeological heritage and paleo - biodiversity in and outside protected Areas
2. දියයට සමුද්‍රිය ලෝකය රැකගනිමු.
3. ජෛව විවිධත්ව සංරක්ෂණය හා පරිහානිර සංරක්ෂණයෙන් එයට ඇති දායකත්වය.



හරිත අරුත මැදිරි වැඩ සටහන

"දියයට සමුද්‍රිය ලෝකය රැකගනිමු" මැදිරි වැඩ සටහන නිෂ්පාදනය කිරීම.

✓ **කාලීන සම්බන්ධතා (Current Affairs)**

දෙපාර්තමේන්තුවේ කාලීන සිදුවීම් හා වනජීවී සංරක්ෂණය හා බැදුණු අන්තර්ජාතික වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති දිනයන් අළලා සංවිධානය කරනු ලැබූ විද්වත් කථිකාවන් 04 ක් 2022 වර්ෂය තුලදී ඇතුලත් කර ඇත.

1. 2022 මාර්තු 03 - ලෝක වනජීවී දිනය - "පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය සඳහා මූලස්ථාන විශේෂ ආරක්ෂාකර ගැනීම."
2. 2022 මාර්තු 21 ලෝක වනාන්තර දිනය - " වනාන්තර තිරසර නිෂ්පාදනය හා පරිභෝජනය"
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක පර්යේෂණ කෘති එලි දැක්වීම.
4. චර්ම පරිකල්ප ශිල්පය පිළිබඳ මැදිරි වැඩ සටහන.



කාලීන සම්බන්ධතා මැදිරි වැඩ සටහන

2022 මාර්තු 03 - ලෝක වනජීවී දිනය නිමිති කරගෙන පැවැත්වූ මැදිරි වැඩ සටහන නිෂ්පාදනය කිරීම.

✓ **වාර්තාමය වැඩසටහන්(Documentaries)**

දෙපාර්තමේන්තුවේ රක්ෂිත ප්‍රදේශ ජාලය ආශ්‍රිතව එහි ඇති පාරිසරික වටිනාකම සහ ස්වභාව සුන්දරත්වයක් අළලා නිෂ්පාදනය කෙරෙන වාර්තාමය වැඩසටහන් ඇතුලත් කිරීමට නියමිතය.



වාර්තාමය වැඩ සටහන නිෂ්පාදනය

පරවි දූපත ජාතික උද්‍යානය හා සමුද්‍රීය ජෛව විවිධත්වය ආශ්‍රිතව වාර්තාමය වැඩ සටහනේ රූගත කිරීම.

- **ශ්‍රී ලංකාවේ ඊ-සයිටිස් (e-CITES) ඉලෙක්ට්‍රොනික සහතික කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.**

✓ ශ්‍රී ලංකාවේ ඊ-සයිටිස් (e-CITES) ඉලෙක්ට්‍රොනික සහතික කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් CITES සහ FFPO බලපත්‍ර අයදුම් කිරීම, නිකුත් කිරීම සහ පාලනය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කිරීමට කටයුතු කර ඇත. රාජ්‍යයන් අතර සිදු කෙරෙන තර්ජනයට ලක්වූ ශාක හා සත්ව විශේෂ සම්බන්ධ වෙළඳාම කාර්යක්ෂම කිරීම සහ ශාක හා සත්ව විශේෂ වල නීති විරෝධී වෙළඳාම පාලනය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

✓ ඒ අනුව 2022 වර්ෂයේ CITES ආනයන බලපත්‍ර 98 ක් හා අපනයන බලපත්‍ර 1169 ක් ද FFPO බලපත්‍ර 126 ක්ද නිකුත්කර ඇත. ඒ තුලින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව උපයා ඇති ආදායම රු.2,060,500 ක් වේ.

2.3 දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අපේක්ෂිත ඉලක්කයන් හා පවතින අභියෝග

	ඉදිරි ඉලක්ක		අභියෝග
1	**වනඝත්ව - මිනිස් ගැටුම් අවම කිරීම**	**1.** පවතින විදුලි වැට කි.මී. 5,018 නඩත්තු කර පවත්වාගෙන යාම. **2.** නව විදුලි වැට කි.මී.750 ක් ඉදිකිරීම. **3.** වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා පර්යේෂණ අත්හදා බැලීම් සිදුකිරීම. **4.** අලි මිනිස් ගැටුම් කළමනාකරණය සඳහා ග්‍රාමීය ජනතාවගේ දායකත්වය ලබාගැනීමට අදාල පාර්ශවයන් දැනුවත්කිරීම හා පුහුණු කිරීම ,ශ්‍රමදාන වැඩ සටහන් පැවැත්වීම, වනජීවී කලාප අවට වෙසෙන ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, **5.** අළුතින් බඳවා ගන්නා ලද බහුකාර්ය නිලධාරින් සඳහා විශේෂ පුහුණුවක් ලබාදී විදුලි වැට නඩත්තු කටයුතු වල යෙදවීම.	✓ විශාල භෞතික හා මානව සම්පත් ප්‍රමාණයක් අවශ්‍යවීම හා දෙපාර්තමේන්තුව තුල පවතින මානව සම්පත් හිඟකම හා සම්පත් හිඟකම. ✓ විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්බන්ධව ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා ඇතිවීම. ✓ ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන(වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි) ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවයේ දී මුහුණ දීමට සිදුවන ගැටළු. ✓ විදුලි වැට කණු මිලදී ගැනීමට පවතින එකම ආයතනය රාජ්‍ය දැව සංස්ථාව වන බැවින් එහි පවතින ධාරිතාවය අනුව ඇතිවන ප්‍රමාදයන්. ✓ විදුලි වැට උපකරණ ආනයනය කිරීමේදී අදාල ආයතනවලින් සිදුවන ප්‍රමාදයන්. ✓ රටේ පැවති අයහපත් ආර්ථික අර්බුදය නිසා වෙන්කල ප්‍රතිපාදන සීමාසහිතවීම හා සංවර්ධන කටයුතු අතර මග නතර කිරීමට සිදුවීම.

2	**රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය**	**1.**රක්ෂිත ප්‍රදේශවල හෙ.692 ක් වාසස්ථාන සුපෝෂණය සිදු කිරීම. **2.**ජල ප්‍රභවයන් 05 ක් අලුත්වැඩියා කිරීම.	✓ වෙළඳපල අමුද්‍රව්‍ය, භාණ්ඩ හා සේවා මිල ගණන් නිරන්තර වෙනස්වීම්වලට ලක්වීම නිසා ගිවිසුම්ගත මිලගණන් වලට වඩා සංවර්ධන කටයුතුවල පිරිවැය ඉහළයාම හා අයවැය චක්‍රලේඛ 3/2022 උපදෙස් පරිදි කටයුතු කිරීමට සිදුවීම. ✓ රක්ෂිත ප්‍රදේශ තුල සංවර්ධන කටයුතු සිදු කිරීමේදී පවතින දුර හා නවාතැන් ගැනීමට අපහසුවීම හේතුවෙන් ඉටුකරන වැඩ කොටස සීමිතවීම.
3	**වනජීවී සෞඛ්‍ය ඒකකවල පහසුකම් වැඩිදියුණුව.**	**1.**පීඩාවට පත්වන වනසතුන්ට ප්‍රතිකාර කිරීමට වනජීවී සෞඛ්‍ය ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීම. • X කිරණ යන්ත්‍රය භාවිතයේදී අවශ්‍යවන ආරක්ෂිත ඇදුම් කට්ටල මිලදී ගැනීම. • සැම පශු වෛද්‍ය ඒකකයටම ශල්‍ය වෛද්‍ය උපකරණ හා මරණ පරීක්ෂණ උපකරණ කට්ටල මිලට ගැනීම. • අත්තිඩිය වනජීවී රැඳවුම් මධ්‍යස්ථානයේ පහසුකම් වැඩිදුයුණු කිරීම(නිර්වින්දන යන්ත්‍රය, Ultra Sound Scanner, Heat Lamp මිලට ගැනීම)	✓ ප්‍රසම්පාදන ක්‍රියාවලයේදී අපේක්ෂිත ගුණාත්මක භාවයෙන් හා තත්වයෙන් උසස් නියමිත ප්‍රමිතියට අනුකූල උපකරණ හා රසායන ද්‍රව්‍ය මිලදී ගැනීමේ අපහසුතාවය. ✓ රටේ පැවති අයහපත් ආර්ථික අර්බුදය නිසා වෙන්කල ප්‍රතිපාදන සීමාසහිතවීම හා සංවර්ධන කටයුතු අතර මග නතර කිරීමට සිදුවීම.
4	**වනජීවී රක්ෂිත ප්‍රදේශ රැක ගැනීම සහ නව රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.**	**1.** කි.මී.100 ක රක්ෂිත ප්‍රදේශ මිනුම් කර මායිම් ගල් යෙදීම. (මුතුරාජවෙල,යෝජිත කලාවැව ජාතික උද්‍යානය හා සෝමාවතිය ජාතික උද්‍යානය ඇතුලුව) **2.** මායිම් කණු 100 ක් ස්ථාපිත කිරීම.	✓ රාජ්‍ය හා පෞද්ගලික සංවර්ධන ව්‍යාපෘති සඳහා රක්ෂිතවල ඉඩම් යොදා ගැනීම සඳහා සිදුකරනු ලබන ඉල්ලීම්. ✓ රක්ෂිත ප්‍රදේශවල හදුනාගත් ඉඩම් සඳහා වෙනත් ආයතනවල එකඟතාවයන් ගැලපීම හා ප්‍රමාදයන් ඇතිවීම. ✓ මිනින්දෝරු දෙපාර්තමේන්තුවත් සමග කටයුතු කිරීමේදී ඔවුන්ගේ සැලසුම් හා කාල රාමුවට අනුව කටයුතු කළයුතුවීම. ✓ වෙළඳපල අමුද්‍රව්‍ය, භාණ්ඩ හා සේවා මිල ගණන් නිරන්තර වෙනස්වීම්වලට ලක්වීම නිසා ගිවිසුම්ගත මිලගණන් වලට වඩා සංවර්ධන කටයුතුවල පිරිවැය ඉහළයාම හා අයවැය චක්‍රලේඛ 3/2022 උපදෙස් පරිදි කටයුතු කිරීමට සිදුවීම.

5	**වනජීවී අපරාධ මැඩලීම සඳහා යාන්ත්‍රණය ශක්තිමත් කර පවත්වා ගෙන යාම**	**1.** වනජීවී අපරාධ මැඩලීම සඳහා SMART මුර සංචාර ක්‍රමය දිවයින පුරා ව්‍යාප්ත කිරීම. **2.** GPS සහ GIS වැනි නව තාක්ෂණ ක්‍රමවේද භාවිතය වැඩිදියුණු කිරීම. **3.** වනසත්ත්ව වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත සහ උසාවි කාර්ය පටිපාටිය සම්බන්ධව නිලධාරීන් දැනුවත් කිරීම. **4.** වනජීවී අපරාධ මැඩලීම සඳහා වර්තමානයට ගැලපෙන පරිදි වනසත්ව හා වෘක්ෂලතා ආඥා පනත සංශෝධනය කිරීම හා නව නීති ඇතුලත් කිරීම. **5.** වනජීවී අපරාධ මැඩලීම සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුවලට සහභාගිවීමට දෙපාර්තමේන්තු නිලධාරින්ට අවස්ථාව සලසා දීම. **6.** වනජීවී අපරාධ මැඩලීම සඳහා තොරතුරු ලබාගැනීමට බුද්ධිමය ඒකකයක් ස්ථාපිත කිරීම.	✓ ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් බහුල පුහුණු නිලධාරින් ප්‍රමාණවත් නොවීම. ✓ නිලධාරින් කණ්ඩායම් වශයෙන් කලාප මට්ටමින් එකවර යොදැගැනීමේ අපහසුව නිසා පුහුනුව අවසන්වනතුරු නිලධාරින්ගේ දැනුම ප්‍රායෝගිකව යොදාගැනීමේ අපහසුතාවය. ✓ අණ පනත් සංශෝධනයේදී ආයතන අතර සම්බන්ධීකරණය අනුව කටයුතු ප්‍රමාදවීම. ✓ බුද්ධිමය ඒකකය ස්ථාපිත කිරීමේදී සුදුසු නිලධාරින් තෝරා ගැනීම හා එම කණ්ඩායම රාජ්‍ය බුද්ධි ඒකකය හරහා පුහුණු කරවා ගැනීම.
6	**රක්ෂිත ප්‍රදේශ අවට ජනතාව සංරක්ෂණයට දායක කර ගැනීම**	**1.** බාහිර පාර්ශවයන් වනජීවී සංරක්ෂණය කටයුතු සඳහා සහභාගි කර ගැනීමට ආකල්ප වර්ධනය කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. **2.** ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	-
7	**පාරිසරික සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම**	**1.** ජාතික උද්‍යානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම (මාර්ග පද්ධති / සනීපාරක්ෂක පහසුකම්/ සංචාරක නිවාසවල තත්ත්වය). **2.** සංචාරකයින් සඳහා නව ඊ-සේවාවන් ප්‍රවර්ධනය කිරීම	✓ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමේදී සැලසුම් කල කාලසීමාව තුල අදාල නීති රීති රාමුව තුල ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්. ✓ සංචාරකයින් වැඩිපුර පැමිණෙන කාලසීමාව තුල සංචාරකයින්ගේ උපරිම ධාරිතාවයට අනුගතවන පරිදි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අපහසුතා.

		(e-ticketing/ e-booking). **3.** ස්වේච්ඡා මාර්ගෝපදේශකයින් සහ ජීප් රථ රියදුරන්ගේ සේවයේ ගුණාත්මකභාවය ඉහල නැංවීමේ අරමුණින් වැඩමුළු පැවැත්වීම. **4.** සංචාරක බෝට්ටු රියදුරන් හා සෆාරි ජීප්රථ රියදුරන් සඳහා හැඳුනුම්පත් ලබාදී සේවාව ක්‍රමවත් කිරීම.	✓ තාක්ෂණ කටයුතුවලදී මුහුණ දීමට සිදුවන අපහසුතාවයන්. ✓ කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුලින් අපේක්ෂිත මට්ටමට ලභාවීම.
8	**දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය**	**1.** වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිලධාරීන් බඳවාගැනීම සහ පුහුණු කිරීම. **2.** ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු ආයතනය අන්තර්ජාතික පුහුණු ආයතනයක් ලෙස සංවර්ධනය කිරීම. **3.** රන්දෙණිගල Tree Center පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය. **4.** දෙපාර්තමේන්තු නිලධාරින්ගේ විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීමේ හැකියා වර්ධනය කිරීම.	
9	**අන්තර් ජාතික සම්මුතින් ක්‍රියාත්මක කිරීම**	**1.** CITES බලපත්‍ර නිකුත් කිරීමේ ඊ-සේවාව ප්‍රවලිත කිරීම. **2.** CITES, RAMSAR, CMS (සංක්‍රමණික ජීව විශේෂ පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය) අන්තර්ජාතික සම්මුතින් ක්‍රියාත්මත කිරීම.	✓ e-CITIES බලපත්‍ර නිකුත් කිරීමේ ඉලෙක්ට්‍රොනික පද්ධතියට ශ්‍රී ලංකා රේගුව සහ අනෙකුත් විද්‍යාත්මක ආයතන ක්‍රියාකාරීව සම්බන්ධ කරගැනීම.
10	**ස්වභාවික අපදාවන් ගෙන් වනජීවින්ට සිදුවන හානි අවම කිරීම.**	**1.** ගිනි ගැනීම් සහ පැතිරීම අවම කිරීමට වනජීවී රක්ෂිත තුල ගිනි පටි ඉදිකිරීම. **2.** නියං සමයේ ජල අවශ්‍යතාවයන් සඳහා රක්ෂිත තුල කෘතීම වතුර වලවල් ඉදිකිරීම සහ පවතින ජල ප්‍රභවයන් සංවර්ධනය කිරීම.	✓ අනපේක්ෂිත කාලගුණික තත්වයන් ✓ කොන්ත්‍රාත්කරුවන් වැඩ අවසන් කිරීමේදී සිදුවන ප්‍රමාදයන්.

11	**නව පර්යේෂණ ප්‍රවණතා**	1.දෙපාර්තමේන්තුව මගින් හෝර්ටන්තැන්න ජාතික උද්‍යානයේ හෙක්. 05 ක "Permanent plot" එකක් දීර්ඝකාලීනව නඩත්තු කිරීම.	✓ වැඩිපුර මිනිස් ශ්‍රමය යෙදවීමට සිදුවීම.
		2. වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුම, කාලීන සිදුවීම්, වාර්තාමය වැඩ සටහන් පිළිබඳව විද්‍යානුකූලව කරුණු ලෝකයට ලබාදීම අරමුණු කර ගනිමින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් "Blue Green Media" නමින් You tube චැනලයක් ආරම්භ කිරීම. එය අනු කොටස් 04 ක් යටතේ වැඩි දුරටත් පුළුල් කිරීම තුලින් විවිධ පැතිකඩ ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් ඉදිරිපත් කිරීම. • Current Affaires Series • Blue Green heritage • Haritha Arutha Program • Documentry	

පරිච්ඡේදය 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එම්සීඑල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	2022 රු.	2021 රු.	
18,000,000	ආදායම් ලැබීම්		26,791,472	17,417,277	
0	ආදායම් බදු	1	-	0	
0	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	0	එමස-1
0	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	0	
18,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	26,791,472	17,417,277	
18,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		26,791,472	17,417,277	
3,623,219,910	ආදායම් නොවන ලැබීම්		3,642,867,650	3,734,420,003	
1,806,060,000	භාණ්ඩාගාර අයිතම		1,806,060,000	3,188,130,000	එමස-3
1,772,159,910	කැන්පතු		1,772,159,910	493,910,758	එමස-4
45,000,000	අත්තිකාරම් ගිණුම්		64,647,740	52,379,245	එමස-5
0	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
3,623,219,910	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**3,642,867,650**	3,734,420,003	
3,641,219,910	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**3,669,659,122**	3,751,837,280	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	0	
3,641,219,910	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**3,669,659,122**	3,751,837,280	
	අඩු කළා : වියදම්				
2,029,000,000	පුනරාවර්තන වියදම්		**2,013,459,073**	1,768,788,750	
1,280,600,000	වැටුප්, වෙනත් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,326,919,738	1,171,925,632	
238,340,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	576,793,629	202,200,348	එමස-2(II)
109,760,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	109,715,706	116,572,724	
0	පොළී ගෙවීම්	8	-	0	
400,300,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	30,000	278,090,046	
2,029,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**2,013,459,073**	1,768,788,750	
227,000,000	මූලධන වියදම්		**148,006,591**	962,299,976	
16,300,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	15,505,589	23,856,330	
7,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	67,945,298	16,831,105	
0	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	0	එමස-2(II)
0	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	0	
5,000,000	භෞතික වර්ධනය	14	4,766,043	7,272,830	
198,700,000	වෙනත් මූලධන වියදම්	15	59,789,660	914,339,711	
227,000,000	මුළු මූලධන වියදම් (උ)		**148,006,591**	962,299,976	
1,514,407,724	කැන්පතු ගෙවීම්		1,514,407,724	1,464,190,259	එමස-4
50,000,000	අත්තිකාරම් ගෙවීම්		60,114,728	73,304,518	එමස-5
(29,207,270)	වැව ගෙවීම්		(29,207,270)	-11,288,826	
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	0	
1,535,200,454	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,545,315,183	1,526,205,951	
3,791,200,454	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,706,780,846	4,257,294,677	
(54,180,282)	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(37,121,723)	-505,457,397	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(37,121,723)	-505,457,397	එමස-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එමස-3

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
		තක්සා	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	32,371,971,551	32,319,393,960
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5(ඒ)	243,047,187	247,580,199
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**32,615,018,738**	**32,566,974,159**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(6,624,077,303)	(6,361,792,105)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		32,371,971,551	32,319,393,960
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4	6,867,124,490	6,609,372,304
අල්ලිම් ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**32,615,018,738**	**32,566,974,159**

පිටු අංක 7 සිට 51 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ ඇමුණුම් පිටු අංක 52 සිට 88 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අත්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සූක්ෂ්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	අධ්‍යක්ෂ (මුදල්)
ආර්.එම්.සී.එම්.හේරත්	එම්.ජී.සී.සූරියබණ්ඩාර	වාමිනී ජයසිංහ
ලේකම්	අධ්‍යක්ෂ ජනරාල්	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	
දිනය : 2023.05. 19	දිනය : 2023.05. 19	දිනය : 2023.05. 19

ආර්.එම්.සී.එම්. හේරත්
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

එම්. ජී. සී. සූරියබණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
වනජීව සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අංක. 811/ඒ, ජයන්තිපුර පාර,
බත්තරමුල්ල.

වාමිනී ජයසිංහා
අධ්‍යක්ෂ (මුදල්)
වනජීව සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අංක. 811/ඒ, ජයන්තිපුර පාර,
බත්තරමුල්ල.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සමාගම	
	2022 රු.	2021 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්		
ගාස්තු, අයිතාර, දඩමුදල් සහ බලපත්‍ර	26,420,599	16,990,757
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	70,379,661	77,714,535
අග්‍රිම ලැබීම්	1,806,060,000	3,188,130,000
අත්තිකාරම් අයකර ගැනීම්	67,787,537	56,952,020
තැන්පතු ලැබීම්	1,772,159,910	493,910,758
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	3,742,807,707	3,833,698,070
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,597,148,397	1,373,980,549
සහනාධාර සහ මාරුකිරීම්	13,057,532	18,714,638
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	533,562,281	3,733,305
වෙනත් පුනරාවර්තන වියදම්	30,000	
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	60,202,301	73,332,573
තැන්පතු ගෙවීම්	1,514,407,724	1,464,190,259
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	3,718,408,234	2,933,951,324
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	24,399,473	899,746,746
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	53,606,743	911,035,570
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	53,606,743	911,035,570
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(53,606,743)	(911,035,570)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(උ)=(ඇ)+(ඊ)	(29,207,270)	(11,288,824)
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
වනසත්ව සංරක්ෂණ අරමුදල	-	
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
ශුද්ධ වැට ගෙවීම්	(29,207,270)	(11,288,825)
වනසත්ව සංරක්ෂණ අරමුදල	0	
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	(29,207,270)	(11,288,825)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	29,207,270	11,288,825
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් - අදාල නොවේ.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරනලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
6000-0-0-6-20	වනසත්ව සංරක්ෂණ අරමුදල	1,343,060	2,164,461	1,641,781	76
2003-02-06	බංගලා ගාස්තු	18,000	18,000	26,791	149

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ඒකාබද්ධ අරමුදල **රු.,000**

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්ථන	1,862,000	2,029,000	2,013,460	99
2022 අයවැය යෝජනා	1,000,000	586,000	501,348	86
ප්‍රාග්ධන	593,000	227,000	148,000	65

වනසත්ව සංරක්ෂණ අරමුදල **රු.,000**

වියදම් ඛාණ්ඩය	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන	සත්‍ය වියදම	උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන,අවසන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් % ලෙස
පුනරාවර්ථන	2,438,400	1,710,990	1,174,870	**69**
ප්‍රාග්ධන	2,496,000	401,170	147,980	**37**

(ඇමුණුම 04)

3.7 මු.රෙ.208 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු., 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් ප්‍රතිපාදනවල %
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	උපාධිධාරී වැටුප් හා දීමනාව ගෙවීම	31,439	31,439	31,439	100
2	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාමගන්නා අවස්ථාවේදී රජයට අයවියයුතු මුදල් සඳහා.	774	774	774	100

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2022** දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය
6111	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	644,653
6112	යන්ත්‍රෝපකරණ	-	825,443
6141	ඉඩම්	-	30,901,876

3.9 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එන්ඩබඑල්/සී/ඩීඩබසී/02/22/08 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 ජූලි 10 දින

13 JUL 2023

ගණන්දීමේ නිලධාරී

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
  - අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
  - හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
  - මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 28 දිනට හෝ ඊට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, වනජීවී සංරක්ෂණ

දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල පැවති ප්‍රමාණාත්මක දෝෂ හේතුවෙන් 2023 අප්‍රේල් 19 දින එම මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගන්නා ලද අතර නැවත සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2023 මැයි 24 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ප්‍රමාද කාලය මාස 02 දින 24 ක් විය.

1.6.2 අත්තිකාරම්

(අ) දෙපාර්තමේන්තු පොත් අනුව පිළිවෙලින් රු.67,898,727 ක් හා රු.60,313,491 ක් වූ අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් පිළිවෙලින් රු.67,787,537 ක් හා රු.60,202,301 ක් වශයෙන් රු.111,190 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා නිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 59 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟගිට තිබුණු අතර එයින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට හිඟ හිටි ණය ශේෂය රු.906,516 ක් ද, වසර 01 ත් 05 ත් අතර හිඟ හිටි ණය ශේෂය රු.924,805 ක් ද, මාස 03 ත් වසර 01 ත් අතර කාලයකට අදාළව අය විය යුතු ණය ශේෂය රු.2,161,315 ක් ද විය.

1.6.3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

(අ) තැන්පතු ගිණුම් අංක 6000-0-0-006-0-020-0 යටතේ වූ තැන්පතු ගෙවීම් දෙපාර්තමේන්තු පොත් අනුව රු.1,347,001,421 ක් ද, භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව රු.1,346,976,898 ක් ද වීමෙන් වෙනස වූ රු.24,523 ක් අග්‍රිම ගැලපුම් ප්‍රකාශයට ගලපා නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අංක SA-11 අනුව වෙනත් ආයතන විසින්, වාර්තා කරන ආයතන වෙනුවෙන් දරන ලද වියදම රු.497,622,992 ක් විය. එසේ වුවද, දෙපාර්තමේන්තු පොත් අනුව රු.1,663,818,150 ක් හා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ අනුව රු.2,161,465,664 ක් වශයෙන් මුළු ශුද්ධ වියදමේ වෙනස රු.497,647,514 ක් වීමෙන්, භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ හා දෙපාර්තමේන්තු පොත් අතර රු.24,522 ක වෙනසක් නිරීක්ෂණය වීමෙන් දෙපාර්තමේන්තු පොත්වල මුළු ශුද්ධ වියදම නිවැරදිව නිරූපණය වන බවට සනාථ කළ නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය	
i. මූදල් රෙගුලාසි 104(3) සහ (4)	වාහන අනතුරු සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, 2019 වර්ෂයේ අනතුරට ලක් වූ දකුණු කලාප කාර්යාලයට අයත් ලුණුගම්වෙහෙර උද්‍යාන පිටුසුම් කාර්යාලයේ වාහනයක පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.
ii. මූදල් රෙගුලාසි 395(ඇ) හා (ඊ) සහ 2017 දෙසැම්බර් 28 දිනැති අංක 04/2017 දරන අභ්‍යන්තර චක්‍රලේඛය	එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් එළඹෙන මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කළ යුතු නමුත් දකුණු පළාත් කළාප කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමට අදාළ 2022 වර්ෂයේ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම මාස 04 කට අධික කාලයක් දක්වා ප්‍රමාද කර තිබුණු අතර එම ප්‍රමාදය වළක්වාලීම්

		ගිණිස ගතයුතු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 31 වන ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු සෑම මාස 12 ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන කිහිපයකට හැර බහුතරයක් වාහන සඳහා එසේ ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.
(ඇ)	2020 ඔක්තෝම්බර් මස 02 වන දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(අ) ඡේදය	ධාවන තත්ත්වයේ නොපවතින හා අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන 2020 අගෝස්තු මස 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 01 කොටසෙහි 13.2 ඡේදයට අදාළ වන මාර්ගෝපදේශ අංක 03 හි සඳහන් වන ක්‍රමවේදය අනුගමනය කරමින් 2020 දෙසැම්බර් මස 31 දිනට පෙර අපහරණය සිදුකළ යුතු වුවත් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ භාවිතයෙන් ඉවත් කර ඇති දකුණු කළාප කාර්යාලයට අයත් යතුරු පැදි 05 ක් සහ අලි ලොරි රථයක් එසේ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 විදේශ ආධාර ව්‍යාපෘති

(අ) සමාලෝචිත වර්ෂයේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා රු.මිලියන 0.72 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ මොණරාගල දිස්ත්‍රික්කයේ රතුගල ප්‍රදේශයේ පවුල් ඒකක 105 ක ජීවන තත්ත්වය නහා සිටුවීමේ ක්‍රියාකාරකම් 05 ක් අත්හැර දමා තිබුණු අතර

රු.මිලියන 232.93 ක ප්‍රතිපාදන යටතේ නිම කිරීමට සැලසුම් කර තිබූ නවත් කාර්යයන් 09 ක් නිම කිරීමට නොහැකි වී තිබුණි. තවද, උඩවලව ජාතික උද්‍යානය හරහා එක් පවුලක් සඳහා පර්චස් 80 ක බුලත් වගා කිරීමට පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ රු.මිලියන 0.770 ක් වැය කර පවුල් ඒකක 14 ක් වෙත ලබා දී තිබුණු බුලත් පැළ රෝගයකට ගොදුරු වී අස්වැන්න ලබා ගැනීමට ප්‍රථම විනාශ වී තිබුණි.

(ආ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 30 දෙනෙකු සඳහා කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) 3 වන ස්ථරයට අයත් වනජීවී කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2017/2018 කණ්ඩායම සඳහා අයකළ පාඨමාලා ගාස්තුව රු.3,300,000 ක් වුවද, 2019/2020 කණ්ඩායම සඳහා ඊට වඩා රු.11,700,000 ක් වැඩියෙන් රු.15,000,000 ක ගාස්තුවක් අයකර තිබුණු අතර මෙම පාඨමාලාව සඳහා වැයකළ මුළු මුදල රු.38,819,579 ක් වීමෙන් එක් නිලධාරියෙකු වෙනුවෙන් වැයකළ මුදල රු.1,293,333ක් වී තිබුණි. එම විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද SLQF 8 වන ස්ථරයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ එක් සිසුවෙකුගේ ගාස්තුව රු.250,000 ක් වීමත්, කොළඹ විශ්ව විද්‍යාලය තෝරාගැනීමේදී ලෝක බැංකුවේ මෙහෙයුම් මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබීමත්, විශ්ව විද්‍යාලයට ගෙවූ රු.21,590,108 කට අදාළ ඉන්වොයිසිවල මුල් පිටපත් හා රු.12,785,500 ක අත්තිකාරම් පියවීමට අදාළ වවුචර්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබීමත් යනාදී කරුණු අනුව ද මෙය අරපිරිමැසුම්දායී ගනුදෙනුවක් බවට නිරීක්ෂණය කළ නොහැකි විය.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) කොන්ත්‍රාත් වියදම රු.1,752,100 ක් වූ දෙමෝදර ආයකපොල්ල හා ආනපල්ලම හඳපානාගල අලි අගල ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රසම්පාදන කාර්යයේදී ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබා නොගෙන, තාක්ෂණික ඇගයීමකින් ද තොරව ලිඛිත ගිවිසුමක් රහිතව අදාළ කාර්යය පවරා තිබීමෙන් එය 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුකූල නොවූවක් බවට නිරීක්ෂණය විය.

(ආ) ආනපල්ලම හඳපානාගල අලි අගලේ දෙවන අදියර ලෙස කිලෝමීටර් 1.5 ක් කැපීම සඳහා ප්‍රාදේශීය ලේකම් වැල්ලවාය විසින් දෙහිලන්දයාය සමිතිය තෝරාගෙන තිබුණ ද, කමිටුවේ අනුමැතිය ලැබීමට දින 02 කට පෙර කොන්ත්‍රාත් වටිනාකම රු.1,587,217 කට දෙපාර්තමේන්තුව එම සමිතිය සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

2019 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ GIZ ව්‍යාපෘතියෙන් ලබා දී තිබුණු රු.20,755,328 ක් වටිනා වත්කම් දෙපාර්තමේන්තු ගබඩාවෙහි වට්ටෝරු පොතට ඇතුළත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පෙර වර්ෂයන්හි විගණන වාර්තා මඟින් කරුණු පෙන්වා දෙනු ලැබුව ද ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

(අ) මුතුරාජවෙල පරිසර පද්ධතියේ හෙක්ටර්යාර 1,285 ක බිම් කොටසක් 1996 අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභය භූමියක් ලෙස ගැසට් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අභය භූමියේ මායිම් ලකුණු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) දකුණු කලාප කාර්යාලය විසින් 2022 වර්ෂය තුළදී මාර්ග දෙපස යටි කැළය ඉවත් කිරීම සඳහා වූ එකතුව රු.5,337,814 ක ප්‍රසම්පාදන කාර්යන් 04 ක් 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සුදුසුකම් පරීක්ෂා නොකර ප්‍රජා පාදක සංවිධාන 03 කට පවරා තිබුණු අතර ඊට අදාළ ගිවිසුම්වලට ද දෙපාර්තමේන්තුව විසින් අත්සන් තබා නොතිබුණි.

(ඇ) 2021 සහ 2022 වර්ෂ තුළදී විදුලි වැට ඉදිකිරීම සඳහා රු.1,251,067,129 ක් ද, එහි නඩත්තුව සඳහා රු.1,031,741,420 ක් ද වැය කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට ඉදිකර තිබුණු සම්පූර්ණ විදුලි වැටෙහි දිග ප්‍රමාණය කිලෝමීටර් 4,756 ක් විය. එසේ වුවද, පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ, දේපළ හානි හා ශාරීරික හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම අවම වීමක් නිරීක්ෂණය නොවූ අතර 2022 වර්ෂයේදී ඒවායේ සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

වර්ෂය	අලි මරණ	මිනිස් මරණ	දේපළ හානි	ශාරීරික හානි
2018	319	96	838*	37*
2019	407	122	2,148*	145*
2020	327	113	850*	75*
2021	375	142	1,326*	58*
2022	439	145	2668*	179*
එකතුව	**1,867**	**618**	**7,830**	**494**

★ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් වන්දි ගෙවන බැවින් දෙපාර්තමේන්තුව සතුව සම්පූර්ණ තොරතුරු නොමැත.

(ඇ) උඩවලව ප්‍රදේශයේ කිලෝමීටර් 1,500 ක් දිග විදුලි වැට ඉදි කිරීම සඳහා අවශ්‍යවන පෙරසවී බල ශක්ති කුටි 194 ක්, පෙරසවී වැසිකිළි 385 ක්, කොන්ක්‍රීට් කියුබ 3,080 ක් හා මීටර් 500 කට ඇනිරීම සඳහා වනඅලි සංවරණ බාධක තැටි 6,000 ක් රු.87,308,715 කට දින 90 ක් තුළ සපයා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2021 මාර්තු 15 දින රෙඩෙකෝ ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කර වැඩ මූලික අත්තිකාරම් ලෙස රු.17,461,743 ක් ලබා දී තිබුණ ද, රු.20,607,554 ක වටිනාකමකට ඇණවුම් කළ ප්‍රමාණයෙන් කොටසක් පමණක් සැපයීම හේතුවෙන් වසරකුත් මාස 06 කට වැඩි කාලයක ප්‍රමාදයකින් පසුව 2022 දෙසැම්බර් 30 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණු අතර සපයන ලද කොටස් සවිකර අවසන් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

4 මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 2,851 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් තථ්‍ය සේවක සංඛ්‍යාව 1,941 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 946 ක් වූ අතර එයින් 27 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු විය. අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට හෝ පවතින සේවක සංඛ්‍යාව මත කටයුතු පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචන කර අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	77	50	27
තෘතියික මට්ටම	18	4	14
ද්විතියික මට්ටම	1864	1134	772
ප්‍රාථමික මට්ටම	892	753	133
එකතුව	2,851	1,941	946

ආර්. එම්. එම්. එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් : 1. ලේකම් - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
2. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%)ලෙස තත්‍ය නිමවුම		
	100%-90%	75%-89%	50%-74%
ඉදිකල විදුලි වැට දිග (කි.මී.)	-	-	√
නඩත්තුකල විදුලි වැට දිග (කි.මී.)	-	-	√
අළුත්වැඩියා කරන ලද ජල ප්‍රභවයන් (සංඛ්‍යාව)	√	-	-
වාසස්ථාන සුපෝෂණය කල බිම් ප්‍රමාණය(හෙක්.)	-	-	√
ස්ථාපිත කරන ලද දැන්වීම් පුවරු (සංඛ්‍යාව)	-	√	-
අළුත්වැඩියා කරන ලද ගොඩනැඟිලි (සංඛ්‍යාව)	√	-	-
අළුත්වැඩියා කරන ලද මාර්ගවල දුර (කි.මී.)	-	-	√
අළුත්වැඩියා කරන ලද සපත්තු පාලම් (සංඛ්‍යාව)	-	-	√
අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා (සංඛ්‍යාව)	-	-	√
වැඩි දියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් (සංඛ්‍යාව)	√	-	-
වැඩි දියුණු කරන ලද ජල සැපයුම් පද්ධති (සංඛ්‍යාව)	√	-	-
වැඩි දියුණු කරන ලද විදුලි සැපයුම් පද්ධති (සංඛ්‍යාව)	√	-	-
යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම (සංඛ්‍යාව)	-	√	-
ක්‍රියාත්මක කල ජනවිඥාපනකරණ වැඩසටහන් (සංඛ්‍යාව)	√	-	-
මිලදී ගන්නා ලද අලි වෙඩි (සංඛ්‍යාව)	√	-	-
නිෂ්පාදනය කරන ලද ගිණි අවි රඳවන (සංඛ්‍යාව)	-	√	-
සවි කරන ලද ගිණි අවි රඳවන (සංඛ්‍යාව)	-	-	√
කෙටි කාලීන පුහුණු වැඩසටහන් (සංඛ්‍යාව)	-	√	-
වනජීවී සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් (සංඛ්‍යාව)	-	√	-
දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදුකරන ලද වනජීවී සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ (සංඛ්‍යාව)	-	-	√
විල්පත්තු ජාතික උද්‍යානයේ බලපෑම් කළමනාකරණ ව්‍යාපෘතිය	√	-	-

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුනු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක (SDG)	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
14.සාගර මුහුදු හා සාගර මූලාශ්‍ර හා සම්පත් තිරසාර සංවර්ධනය උදෙසා සංරක්ෂණය කරමින් තිරසාරව භාවිතා කිරීම	**14.7** සමුද්‍ර ජීවීන් සංරක්ෂණය	• සමුද්‍ර සංරක්ෂණය උදෙසා ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් හා වැඩමුළු. • අලුත්වැඩියා කරනලද කැසබෑ සංරක්ෂණ මධ්‍යස්ථාන.	√	-	-
15. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම, ප්‍රතිසංස්කරණ තිරසාර භාවිතය උදෙසා ප්‍රවර්ධනය, වනාන්තර තිරසාර ලෙස කලමනාකරණය, කාන්තාරකරණය ට එරෙහිව සටන් කිරීම, ජෛව විවිධත්වයට වන හානිය අවම කිරීම.	**15.1** ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම	• වනජීවී රක්ෂිත ප්‍රදේශවල ඉදිකරන ලද නව ගොඩනැගිලි සංඛ්‍යාව. • මිලදි ගන්නා ලද යන්ත්‍ර හා කාර්යාල උපකරණ, වාහන සංඛ්‍යාව.	-	√	-
	15.1 ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුනු කිරීම්	• අලුත්වැඩියා කරන ලද ගොඩනැගිලි, කාර්යාල උපකරණ, වාහන සංඛ්‍යාව. • වනජීවී රක්ෂිත ප්‍රදේශ මැණුම් කිරීම හා වෙන් කිරීම.	-	-	√
	15.1 වනජීවී සංරක්ෂණය උදෙසා මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	• වනජීවී සංරක්ෂණය උදෙසා පුහුණු කරන ලද දේශීය වැඩ සටහන් සංඛ්‍යාව • බාහිර පාර්ශවයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	-	-	√
	15.1 රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය	• ජාතික උද්‍යානවල වැඩිදියුණු කරන ලද මාර්ග පද්ධතිවල දුර ප්‍රමාණය(කි.මී.). • සංවර්ධනය කරන ලද සනීපාරක්ෂක පහසුකම් සංඛ්‍යාව. • සංවර්ධනය කරන ලද ජල සැපයුම් පද්ධති හා සූර්යබල සැපයුම් පද්ධති සංඛ්‍යාව.	-	√	-

	15.1/15.9 15.c වනඅලි මිනිස් ගැටුම අවම කිරීම	• අළුතින් ඉදිකරන ලද විදුලි වැට දිග ප්‍රමාණය(කි.මී.) • නඩත්තු කරන ලද විදුලි වැට දිග ප්‍රමාණය(කි.මී.) • නඩත්තු කරන ලද විදුලි වැට ආරක්ෂක කුටි සංඛ්‍යාව. • මිලදී ගන්නාලද අලි වෙඩි ප්‍රමාණය • මිලදීගන්නා ලද විදුලි වැට උපකරණ සංඛ්‍යාව	-	√	-
	15.1/15.8 /15.9/15.c වනජීවී මිනිස් ගැටුම අවම කිරීම	• වැඩිදියුණු කරන ලද වනජීවී වාසස්ථාන සංඛ්‍යාව. • පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීම් හා අධ්‍යාපන වැඩ සටහන් සංඛ්‍යාව.	-	-	√
	15.4/15.8/15.9/ 15.c දේශීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය මාර්ග අවස්ථාවන් වැඩිකර ගැනීම	• රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන්ගේ ආර්ථික තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ප්‍රජා ව්‍යාපෘති සංඛ්‍යාව.	-	√	-
	15.5/15.6/15.7/ 15.c වනසත්ව හා වාක්ෂලතා ආඥා පනත හා වඳවීමේ තර්ජනයට ලක්වී ඇති වනසතුන් හා පැලෑටිවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය ක්‍රියාත්මක කිරීම	• නිකුත් කරන ලද CITES හා FFPO බලපත්‍ර සංඛ්‍යාව	-	-	√
	15.5/15.c වනජීවී සංරක්ෂණය උදෙසා නූතන ක්‍රමවේදයන් පිළිබඳ ජාත්‍යන්තර පුහුණුව	• පුහුණු කරන ලද දේශීය හා විදේශීය වැඩ සටහන් සංඛ්‍යාව	-	√	-

5.2 තිරසර සංවර්ධන අභිමතාර්ථ 14 හා 15 සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- **ජයග්‍රහණ**

i. රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ප්‍රජාවන් එකී රක්ෂිත ප්‍රදේශ මත යැපීම අඩුකිරීම සහ එම ප්‍රජාවන්ගේ ආර්ථික තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් ග්‍රාමීය ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් වනසත්ව මිනිස් ගැටුම් අවම කිරීමට හැකියාව ලැබීම.

ii. රටතුල ආර්ථික අර්බුදයක් පැවති කාලසීමාවේදී පවා රක්ෂිත ප්‍රදේශතුල පරිසර පද්ධතින් සංරක්ෂණය කරමින් සංචාරක කර්මාන්තය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා වැඩි කිරීම හා එමගින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාව ලැබීම.

iii. වනජීවින්ගේ වාසස්ථාන සුපෝෂණ කටයුතු වැඩිකිරීම තුලින් වනඅලි මිනිස් ගැටුම අවම කිරීමට හැකියාව ලැබීම.

iv. අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් මගින් මහජනතාව තුල සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහල නැංවීමට හැකිවීම.

v. CITES බලපත්‍ර නිකුත් කිරීමේ ඊ-සේවාව හා CITES, RAMSAR වැනි අන්තර්ජාතික සම්මුතින් ක්‍රියාත්මත කිරීම තුලින් ජාත්‍යන්තරය සමග කටයුතු කිරීම පහසුවීම.

- **අභියෝග**

i. රටේ පැවති අයහපත් ආර්ථික අර්බුදය නිසා වෙන්කල ප්‍රතිපාදන සීමාසහිතවීම හා සංවර්ධන කටයුතු අතරමග නතර කිරීමට සිදුවීම.

ii. තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව ප්‍රජාව දැනුවත් නොවීම.

iii. නව හඳුන්වාදීම් එකවර ග්‍රහනය කරගැනීමට පවත්නා උනන්දුව අඩුවීම.

iv. තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාගැනීමට යාමේදී අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත්වල හිහකම.

v. රජය හා පෞද්ගලික අංශ මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ස්වභාවික හා ජෛව සම්පත්වල ආරක්ෂාවට හා පැවැත්මට තර්ජන ඇතිවීම.

vi. විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්න්ධව ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා ඇතිවීම.

vii. ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි) ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවයේදී මුහුණදීමට සිදුවන ගැටළු

viii. කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුලින් අපේක්ෂිත මට්ටමට ලභාවීමට ඇති නොහැකියාව.

පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ (Senior Level)	77	50	27
තෘතීයික (Teritary Level)	18	4	14
ද්විතියික (Secondary Level)	1864	1134	730
ප්‍රාථමික (Primary Level)	892	753	139

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

පවතින රාජකාරි වපසරිය ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැත.

- කාර්ය මණ්ඩල අවශ්‍යතාවය හඳුනාගෙන ඉල්ලුම්කර ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු සඵලදායීව සාක්ෂාත් කර ගැනීම සඳහා සේවක හිඟය දැඩිසේ බලපානු ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

පුහුණු වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව/ පිටපත් සංඛ්‍යාව	වැඩ සටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු 000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම (ලබා ගත් දැනුම)
			දේශීය	විදේශීය		
අලිමිනිස් ගැටුම් කළමනාකරණය සඳහා විදුලි වැට නඩත්තුව(දෙපාර්තමේන්තු නිලධාරීන් හා සිවිල් ආරක්ෂක නිලධාරීන්).	705 (පුහුනු වැඩ සටහන්39)	දින 01	1396	-	දේශීය	විදුලි වැට නඩත්තුව හා අලි මිනිස් ගැටුම කළමනාකරණ කටයුතු සිදුකලයුතු ආකාරය පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම.
සන්නිවේදන පද්ධති භාවිතය සහ නඩත්තු කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම.	50 (පුහුණු වැඩ සටහන් 1)	දින 05	382	-	දේශීය	සන්නිවේදන පද්ධති භාවිතය සහ නඩත්තු කටයුතු පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම.
බංගලා භාරකරුවන් සඳහා පුහුණුව.	15 (පුහුණු වැඩ සටහන් 01)	දින 03	171	-	දේශීය	ආහාර පිසීම,ආගන්තුක සත්කාර ක්‍රමවේද හා බංගලා නඩත්තුව.
දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා	105 (පුහුණු වැඩ	දින 12	2,225	-	දේශීය	රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මකවීම යටතේ

දෙමළ භාෂාව පුහුණුව.	සටහන් 3)					දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කිරීම.
කාර්යාලීය ක්‍රම, මූල්‍ය කළමනාකරණ කටයුතු සහ පාරිසරික සංචාරක කටයුතු පිළිබඳ පුහුණු වැඩ සටහන.	103 (පුහුණු වැඩ සටහන් 3)	දින 03	1,088	-	දේශීය	අදාල විෂය දැනුම ලබාදීම.
ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ පුහුණුව	02 (පුහුණු වැඩ සටහන් 01)	දින 02	18	-	දේශීය	අදාල විෂය දැනුම ලබාදීම.
මූලික විමර්ශන කටයුතු පිළිබඳ පුහුණුව.	83 (පුහුණු වැඩ සටහන් 2)	දින 01	226	-	දේශීය	විමර්ශණ කටයුතු පිළිබඳ සහ විමර්ශණ වාර්ථා ලිවීම පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම.
ස්වේච්ජා මාර්ගෝපදේශ පුහුණුව.	24 (පුහුණු වැඩ සටහන් 01)	දින 03	291	-	දේශීය	සත්ව විශේෂ සංරක්ෂණය සහ ඔවුන් අධ්‍යයනය පිළබඳව නිලධාරීන් දැනුවත් කිරීම.
පරියේෂණ පත්‍රිකා ලිවීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ පුහුණුව.	24 (පුහුණු වැඩ සටහන් 01)	දින 02	212	-	දේශීය	පර්යේෂණ පත්‍රිකා ලියන ආකාරය හා ඉදිරිපත් කිරීම් සිදු කරන ආකාරය පිළිබඳ පුහුණුව.
සර්පයින් හැසිරවීම පිළිබඳ පුහුණුව.	20 (පුහුණු වැඩ සටහන් 01)	දින 01	17	-	දේශීය	සර්පයින් හැසිරවීම පිළිබඳ වනජීවී නිලධාරින්ට පුහුණුව ලබාදීම.
මරණ පරීක්ෂණ වාර්තා සැකසීම පිලිබඳ පුහුණුව.	18 (පුහුණු වැඩ සටහන් 01)	දින 01	112	-	දේශීය	සත්වයින් මියගිය පසු මරණ පරීක්ෂණ වාර්තා සැකසීම පිළිබඳ පශු වෛද්‍ය නිලධාරින් දැනුවත්භාවය ලබාදීම.
දිගුකාලීන පුහුණු පාඨමාලා (පශ්චාත් උපාධි පාඨමාලාව).	03 (පුහුණු වැඩ සටහන් 02)	වර්ෂ 02	861	-	දේශීය	නිලධාරින්ගේ කුසලතා වර්ධනය.
ආක්‍රමණශීලී ශාඛ හඳුනා ගැනීම.	25 (පුහුණු වැඩ සටහන් 01)	දින 01	56	-	දේශීය	නිලධාරින්ගේ කුසලතා වර්ධනය.
රාජකාරි විෂයානුබද්ධ කෙටිකාලීන පුහුණු ලබාදීම.	05 (පුහුණු වැඩ සටහන් 01)	දින 01	146	-	දේශීය	නිලධාරින්ගේ කුසලතා වර්ධනය.
දෙපාර්තමේන්තු පර්යේෂණ	08 පර්යේෂණ	මාස 6-7 අතර	255	-	දේශීය	දෙපාර්තමේන්තු නිලධාරීන් රක්ෂිත කලාප කළමනාකරණ කටයුතු සඳහා අදාල පර්යේෂණ වල ප්‍රතිඵල යොදාගැනීම.

දෙපාර්තමේන්තුවෙන් පරිභාහිර පුද්ගලයින් සඳහා පර්යේෂණ කිරීමට අවසර ලබාදීම.	පර්යේෂණ 68	-	-	-	දේශීය	දෙපාර්තමේන්තු නිලධාරීන් රක්ෂිත කලාප කළමනාකරණ කටයුතු සඳහා අදාල පර්යේෂණවල ප්‍රතිඵල යොදාගැනීම.
වනජීවී සහරාව මුද්‍රණය හා ගුවන් විදුලි වැඩ සටහන් ප්‍රචාරය කිරීම.	සහරා පිටපත් 1000 ක් මුද්‍රණය කිරීම	-	700	-	දේශීය	වනජීවී සංරක්ෂණ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් හා මහජනතාව දැනුවත් කිරීම.

***ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

1. ආයතනයේ නිලධාරින්ගේ පුහුණු වැඩ සටහන්/ධාරිතා වර්ධන වැඩ සටහන් හරහා දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමෙන් ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
2. නව තාක්ෂණික ක්‍රමවේදයන් මානව සම්පත හරහා ආයතනයට අවශෝෂණය කර ගැනීම තුළින් ආයතනික ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කරගැනීමට හැකිවීම හා වඩා ඵලදායී සේවාවක් ලබාදීමට හැකිවීම.
3. ආයතනයේ විධායක හා කළමනාකරණ මට්ටම හා පහළ ශ්‍රේණිවල නිලධාරීන් අතර මනා සන්නිවේදන ක්‍රමවේදයක් ඇතිකිරීම මඟින් ඔවුන් අතර සුහදතාවය වර්ධනය වන නිසා , ඇතිවන ගැටලුකාරී තත්වයන් සාකච්ජා මාර්ගයෙන් විසඳා ගැනීමට හැකිවීමෙන් ආයතනයේ ඵලදායීතාව ඉහළ නැංවීම.
4. ආයතනික දැක්ම,මෙහෙවර සහ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය නිපුණතා වලින් හෙබි මානව සම්පත වර්ධනය කර ගත හැකිවීම.
5. වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා බාහිර පාර්ශවයන් සහභාගි කරගැනීමට දැනුවත් කිරීමේ වැඩ සටහන් උපකාරීවීම හා අලිමිනිස් ගැටුම කළමනාකරණය සඳහා ග්‍රාමීය ජනතාවගේ දායකත්වය ලබාගැනීමට හැකිවීම.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	අදාල නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ	අදාල නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ	අදාල නොවේ	
1.6	වෙනත්	අනුකූල නොවේ	අදාල නොවේ	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ(CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය(GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	ආයතනය තුල මූල්‍ය බලතල පවරාදී තිබීම.	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම.	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමතවන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NDB) ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාන්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම.	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**	අනුකූල වේ	-	-
6.1	මු.රෙ.134(2)DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	විගණන විමසුම යොමුකරන අංශය හෝ ආයතනය විසින් පිළිතුරු ඉදිරිපත් නොකිරීම.	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී විගණන විමසුම් සඳහා පිලිතුරු ලබාදීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල	අනුකූල වේ	-	-

	පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම.			
6.4	මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
7	**විගණන කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂයතුල පවත්වාගෙන තිබීම.	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව , වත්කම් මිලදී ගැනීම හා අපහරණයකිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පර්ච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිතවී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණයකර තිබීම.	අනුකූල නොවේ	ප්‍රායෝගිකව මාස 06කට වඩා ගතවීම.	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙනයාම.	අනුකූල වේ	-	-

9.4	සැම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල නොවේ	104(අ) මු.රෙ.පරීක්ෂණ අවසන් කිරීමට නියෝග ලබාදී ඇත.	2022 වර්ෂයට අදාල මු.රෙ. පරීක්ෂණ වාර්තා එම වර්ෂයේදීම අවසන් කිරීමට කමිටුවක් පත්කිරීම සුදුසුවේ.
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනයවීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙලකර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	අදාල නොවේ	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණයවූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම.	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණයශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතුකර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිනුම්	අනුකූල වේ	-	-

	යාවත්කාලීනකර පවත්වාගෙනයාම.			
14	**අග්‍රිම ගිනුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාන්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත්කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය , භාන්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම.	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මන්ඩල සිමාවතුළ කාර්ය මන්ඩලය පවත්වාගෙනයාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මන්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛණයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-

17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ.	වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සෘජුවම සංචාරක බංගලා වෙන්කිරීම සම්බන්ධව පමණක් වුවද මෙයද මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ කරගතහැකි බැවින් පුරවැසි ප්‍රඥප්තියක් සැකසීමේ අවශ්‍යතාවයක් පැන නොනැගේ.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම්කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැළැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ	-	-